JMC JAYASEKERA MANAGEMENT CENTRE
"Pioneers in Professional Education"

# වරලත් ගණකාධිකරණය – BL 01

## මූල්‍ය ගිණුම්කරණය

Sandeepa Jayasekera

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner.

1

# මූලාශ්‍ර ලියවිලි සහ ගිණුම් වාර්තා

Sandeepa Jayasekera - JMC 2

2

## ගිණුම් වාර්තා

මූලාශ්‍ර ලියවිලි → මූලික උපයෝගී පොත් → ලෙජර් ගිණුම් → ශේෂ පිරික්සුම → මූල්‍ය ප්‍රකාශ

Sandeepa Jayasekera - JMC 3

3







ගිණුම් වාර්තා පවත්වාගන්න අවශ්‍ය ඇයි?

- නීතිමය කටයුතුවලට
- බදු කටයුතුවලට
- මූල්‍ය ප්‍රකාශ සෑදීමට
- පාලනයට





Sandeepa Jayasekera - JMC


4

JMC vLearning "your virtual learning partner"

# මූලාශ්‍ර ලියවිලි



5



BEYOND COMPUTER SYSTEM (PVT) LTD

NO:144 B WJAYAKUMARATHUNGA MAWATHA,
COLOMBO - 05
TEL : 0112820199

INVOICE

| DATE | INVOICE NO |
|---|---|
| [illegible] | [illegible] |

INVOICE TO

JAYASEKARA MANAGEMENT CENTER
65/2A,CHITTAMPALAM A GARDINER
MAWATHA,
COLOMBO 02

| P.O. NO. | REP |
|---|---|
| | |

| DESCRIPTION | QTY | RATE | AMOUNT |
|---|---|---|---|
| INTEL CORE I-3 PROCESSOR & MOTHER BOARD | 1 | 43,800.00 | 43,800.00 |

| | |
|---|---|
| SUBTOTAL | 43,800.00 |
| TOTAL | Rs.43,800.00 |

All Cheques to be drawn for "BEYOND COMPUTER SYSTEM (PVT) LTD."


No warranty for physical damages, water damages, lightning, corrosions, Keyboard,Mouse,Power Audapter,Speaker and any other natural disaters.

ID No.............................

Customer Signature .............................



6



JOHN KEELLS OFFICE AUTOMATION (PVT) LTD.

Customer Copy

| INVOICE NO. | PAGE NO. | DATE |
|---|---|---|
| 748275938 | 1 of 1 | Feb 17/2022 |

BILL - TO: J M C Jayasekara Mangement Centre (Pvt) Ltd
65/2A,Chittampalam Gardiner Mawatha
Colombo 02

VAT Registration No :
SVAT No :

Invoice

INSTALL LOCATION: J M C Jayasekara Mangement Cen
JMC Jayasekara managemant center ,65/2A , chittampalam
Gardiner mw , colombo 2

Order No: 0622075604 Delivery No: 0611075325

Printed on: 17.02.2022 - 14:16:36

| CUSTOMER CODE | CUSTOMER P/O # | SALESMAN CODE | CREDIT LIMIT | BALANCE OUTSTANDING | TERM | ZONE |
|---|---|---|---|---|---|---|
| 57278 | PS44941 | TP1 | | | 15 Days | |

| PART NO. / MODEL NO. | DESCRIPTION / ITEM / SERIAL NUMBER | QTY. | UNIT VALUE | DISC. % | VALUE | VAT% | VAT AMOUNT | TOTAL VALUE |
|---|---|---|---|---|---|---|---|---|
| [illegible] | [illegible] | 1 | [illegible] | 100 % | 0.00 | | | 0.00 |
| [illegible] | [illegible] | 1 | [illegible] | 100 % | 0.00 | | | 0.00 |
| [illegible] | [illegible] | 1 | [illegible] | 100 % | 0.00 | | | 0.00 |
| [illegible] | [illegible] | 1 | [illegible] | 100 % | 0.00 | | | 0.00 |

Invoice Message Lines

John Keells Office Automation (Pvt) Ltd.

This is a computer generated invoice, No manual signature required.

| | |
|---|---|
| TOTAL VALUE | |
| NBT AMOUNT | 0.00 |
| TOTAL VAT AMOUNT | |
| TOTAL INVOICE VALUE | 2,583.22 |
| Discount | 0.00 |

Received the above goods in good condition.



7

## ඉන්වොයිසිය

ගැනුම් හෝ විකුණුම් ඇණවුමකට අදාළ වේ

පාරිභෝගිකයාට ඉන්වොයිසිය ලැබේ




විකුණුම්කරු ඉන්වොයිසිය නිකුත් කරයි

ණයට ගැනුම් සහ විකුණුම් වෙනුවෙන්



8

# ඉන්වොයිසියේ භාවිතයන්

පාරිභෝගිකයාගෙන් විකුණුම් මුදල ඉල්ලීමට



ගිණුම් දෙපාර්තමේන්තුවට ගෙවීම් සැසඳීමට





9

# ඉන්වොයිසියේ භාවිතයන්

විකුණුම් දෙපාර්තමේන්තුවට විකුණුම් වාර්තා කිරීමට




ගබඩා අංශයට භාණ්ඩ යැවුම් සටහන් පත්‍රය පිළියෙල කිරීමට





10



CUSTOMER COPY

TAX INVOICE

CREDIT

ISO 9001 - 2008 Certified Company COPY

NIPPON PAINT LANKA (PVT) LTD

Member of NIPSEA Group

Colombo Office : Nippolac Towers, No. 69 A, Buthgamuwa Road, Rajagiriya. Tel: 011-4356900 - 8 Fax: 011-4356909

Matara Office : 67, Kumaradasa Mawatha, Matara. Tel: 041-4933530 - 8 Fax: 041-4390436

www.nipponpaint.com.lk

Technical Center : Tel : 011-4449488

INVOICE NO.: 2701068877

JMC JAYASEKARA MAANAGEMENT CENTRE (PVT) LTD
65/2A,
CHITTAMPALAM GARDINER MW,
COLOMBO 02

DEALER CODE : 3010000860 P.O.NO.: KDU-19(01)

Serial No : 1176823

DATE : 26.02.2019
ORDER NO. : 2689052016
DELIVERY NOTE : 2695075363
REP.CODE : 00000116
P.O. NO. : KDU-19(01)
NBT REG.NO. 104024890 - 9000
VAT REG.NO. 104024890 - 7000
SVAT NO. 003665

| TEM CODE | DESCRIPTION | BATCH NO. | QTY. | RATE | VALUE |
|---|---|---|---|---|---|
| PTPTSTU0008 | NIPPOLAC SUPER TURPENTINE 2LT | 1101565717 | 4 | 880.00 | 3,520.00 |
| | | | Gross Value | | 3,520.00 |
| | | | Less Discount ( | 25.00-%) | 880.00-) |
| | | | Subtotal | | 2,640.00 |
| | | | Grand Total | | 2,640.00 |




11

# බැරපත

විකුණූ භාණ්ඩ ආපසු හරවා එවීම් හෝ වැඩිපුර ගෙවීමක් වෙනුවෙන් සැපයුම්කරුවෙකු විසින් ගණුදෙනුකරුට යවන ලියවිල්ල බැර පතක් වේ. තොරතුරු රතු වර්ණයෙන් මුද්‍රණය වේ

- වෙනම අනුක්‍රමික අංක ඇත
- භාණ්ඩ හරවා යැවීමට හේතු දක්වයි.



[Your Logo] [Your Web Address]

CREDIT NOTE

[Customer Name]
[Customer Address 1]
[Customer Address 2]
[Customer Town]
[Customer City]
[Customer Postcode]

Date: 1st October 2012

Credit Note Number: CN-0001

VAT Number: GB12345678

[Your Company Name]
[Address 1]
[Address 2]
[City]
[Town]
[Postcode]

| Description | Quantity | Price | Amount |
|---|---|---|---|
| Faulty Widgets on Invoice INV-0001 | 2 | 10.00 | 20.00 |
| Service One - Partial Refund (Hours) | 3 | 40.00 | 120.00 |
| | | Subtotal | 140.00 |
| | | TOTAL | 140.00 |

මෙය ඉන්වොයිසියට සමාන වුවද සැපයුම්කරු ගැණුම්කරුට නිකුත් කරයි.



12

JMC vLearning "your virtual learning partner"

# හරපත

ණයට ගත් භාණ්ඩ ආපසු හරවා යැවීමක් හෝ වැඩිපුර ගෙවීම් කරන ලද අවස්ථාවක ගණුදෙනුකරුවන් විසින් සැපයුම්කරුට යවන ලියවිල්ල. මෙය ගණුදෙනුකරු විසින් සැපයුම්කරුට බැරපතක් නිකුත් කරන ලෙස කරන විධිමත් ඉල්ලීමක් ද වේ.

ගැණුම්කරු විසින් සැපයුම්කරුට නිකුත් කරයි.

**Debit Note**

Debit Note# CDN-000004

Zylker India,
44 Annasalai,
Chennai 600002, India.

GSTIN: 33GSPTN0371G1ZD
Phone: 98573829384
PAN 312456789

Balance Due ₹103.00

**Bill To**
Ambit Depots,
10 Thakur Street, Chennai 600450
Tamil Nadu, India.

GSTIN: 33GSPKA0371G1FE
Phone: 982309583
Circuit ID: 57686533GSPKA0371G1FE

Debit Note Date : 05 Sep 2017
Terms : Due on Receipt
Due Date : 05 Sep 2017
Reference Invoice# : PC106
Reference Invoice Date : 03 Aug 2017

Place Of Supply: Tamil Nadu (33)

| # | Item & Description | Rate | CGST | SGST | Amount |
|---|---|---|---|---|---|
| 1 | Item rate adjusted | 100.00 | 1.50 1.5% | 1.50 1.5% | 100.00 |

Sub Total 100.00
CGST 1.5 (1.5%) 1.50
SGST 1.5 (1.5%) 1.50
Total ₹103.00
Balance Due ₹103.00





# මිල කැඳවුම (මිල ගණන් දැන්වීම)

අලෙවිකරණ භාණ්ඩ සහ සේවාවල ස්ථාවර මිල ගණන් දක්වමින් සැපයුම්කරු විසින් ගැණුම්කරුට යවන ලියවිල්ල

CIB SHOPPING CENTRE
No. 119, Main Street,
Kaduruwela.
Tel.: 0272227030 Mobile: 0772930939 Fax: 0272227031

A Subsidiary of Wijaya Group (Pvt) Ltd.

2020/01/02

J.M.C ...

මිල ගණන් දැනුම් දීම

| අයි. අංක | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල(රු.) | වටිනාකම(රු.) |
|---|---|---|---|---|
| 01 | වර්ටිකල් බ්ලයින්ඩ් | වර්ග අඩි 229 | 185.00 | 42 365.00 |

| අයි. අංක | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල(රු.) | වටිනාකම(රු.) |
|---|---|---|---|---|
| 01 | වර්ටිකල් බ්ලයින්ඩ් | වර්ග අඩි 24 | 185.00 | 4440.00 |

| අයි. අංක | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල(රු.) | වටිනාකම(රු.) |
|---|---|---|---|---|
| 01 | 110" | මීටර් 8.25 | 595.00 | 4908.70 |
| 02 | | මීටර් 8.25 | 125.00 | 1031.25 |
| 03 | | අඩි 10.5 | 110.00 | 1155.00 |
| | මුළු වටිනාකම | | | 7095.00 |

CIB Shopping Centre
Kaduruwela
Branch Manager





# Quotations

**SAMANALA TRADING & REXINE CENTER**

Sales Quotation

63/C, MAKOLA NORTH , MAKOLA
TEL : 0753913431 / 0112913431

Date : 21/04/2021
Quotation No : 113
Valid Upto : 21/04/2021

Customer : JMC FORT

| | Item Description | Qty | Selling Price | Unit Total |
|---|---|---|---|---|
| 1. | EX CHAIR, LOW BACK, GAS LIFT | 1.00 | 13250.00 | 13250.00 |
| 2. | WRITING TABLE(120X60X76.5cm) 1D 1C | 1.00 | 16190.00 | 16190.00 |
| 3. | 6X3 OFFICE CUPBOARD (PREMIUM) | 1.00 | 22130.00 | 22130.00 |
| 4. | EX PREMIUM CHAIR, HIGH BACK, NY BASE, PI ARM, GAS LIFT | 1.00 | 17690.00 | 17690.00 |





# මිලදී ගැණුම් ඇණවුම

සැපයුම්කරුවන්ගෙන් මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා පිළිබඳ විස්තර කරන ලියවිල්ල. මෙහි එක් පිටපතක් සැපයුම්කරුට යවන අතර අනික් පිටපත ආයතනයේ අභ්‍යන්තර වාර්තා සඳහා තබා ගනී.

PLANERGY

**PLANERGY™**
Boston Office
One Post Office Square, Suite 3600
Boston MA, 02109
USA

**Purchase Order**
PO No: PO00495
04/26/2017
PO Status Closed Completed

| SUPPLIER | DELIVERY ADDRESS |
|---|---|
| Taylor Dickens<br>70 Bowman St.<br>South Windsor, CT 06074<br>USA<br>Terms: 30 Days<br>Phone No: 800-123-4567<br>Email: john@taylorcdickens.com | Boston Office<br>One Post Office Square, Suite 3600<br>Boston MA, 02109<br>USA<br>Phone No: 800-123-4567<br>Attn: Patrick |

| DELIVERY DATE | REQUESTED BY | APPROVED BY | DEPARTMENT |
|---|---|---|---|
| 04/28/2017 | Patrick Smith | John Smith | IT Department |

NOTES
Description ABC

| ITEM NAME | ITEM CODE | QTY | ITEM PRICE | DISC. | TOTAL |
|---|---|---|---|---|---|
| Nescafe Gold Blend Coffee 7oz | QD2-00350 | 1.00 | 34.99 | 0.00 | 34.99 |
| Tettley Tea Round Tea Bags 440/Pk | QD2-TET440 | 1.00 | 20.49 | 0.00 | 20.49 |
| Niceday Economy Lever Arch File A4 Black | QB1-4857579 | 15.00 | 1.90 | 0.00 | 28.50 |
| 3 Tier Letter Tray | QD2-1523055 | 3.00 | 23.89 | 0.00 | 71.67 |
| Viking A4 Economy Copier | QD2-9537 | 5.00 | 3.59 | 0.00 | 17.95 |
| Economy Manila Envelopes - 500 | QD2-2071074 | 2.00 | 15.49 | 0.00 | 30.98 |
| 3 Tier Letter Tray | QD2-1523055 | 1.00 | 23.89 | 0.00 | 23.89 |
| | | | | ORDER TOTAL | $228.47 |

# විකුණුම් ඇණවුම


ගැණුම්කරු එවූ ගැණුම් ඇණවුම පදනම් කරගනිමින් විකුණනු ලබන භාණ්ඩ සහ සේවා විස්තර කරමින් විකුණුම්කරු පිළියෙල කරනු ලබන ලේඛනය. ගැණුම්කරුට විකුණන භාණ්ඩ සම්බන්ධයෙන් වාර්තා තබාගත යුතු බැවින් මෙය අනුක්‍රමික අංක පිළිවෙලකට වාර්තා කරයි.




17

# භාණ්ඩ ලැබීමේ පත්‍රිකාව

සැපයුම්කරුවන්ගෙන් ලද භාණ්ඩ ලැයිස්තුගත කරමින් ගැණුම්කරු පිළියෙල කරන ලේඛනය. භාණ්ඩ භාර ගත්ත ශාඛාවෙන් මෙම ලියවිල්ල පිළියෙල කරයි. භාණ්ඩ ලැබීම සහතික කිරීම සහ සටහන් කිරීම මෙම ලියවිල්ලෙන් සිදු වේ. සැපයුම්කරුට ගෙවීම ක්‍රියාත්මක කිරීමට පෙර ගිණුම් අංශය විසින් ගැණුම් ඇණවුම සහ භාණ්ඩ ලදුපත පරීක්ෂා කර වෙනසක් නොමැති බව තහුවරු කර ගනී.







18

# භාණ්ඩ භාරදිමේ පත්‍රිකාව

භාණ්ඩ විකිණීමේදී ගැණුම්කරුට භාරදීමට යවන ලද භාණ්ඩ පිළිබඳ විස්තර ඇතුලත් කර පිළියෙල කරන ලියවිල්ල. යවන ලද භාණ්ඩ පිළිබඳ ගැණුම්කරු විමසීමක් කලහොත් තොරතුරු ලබා දීමට මෙය තබා ගනී. ගැණුම්කරු ලද භාණ්ඩ, භාණ්ඩ භාරදීමේ පත්‍රිකාව සමඟ සංනිවේදනය කරන ලද භාණ්ඩ නිසි පරිදි ලැබුණු බව තහවුරු කර ගනී.






19

# විස්තර ප්‍රකාශනය

යම් කාලපරිච්ඡේදයක් සඳහා ගැණුම්කරුට කළ විකුණුම් ඉන්වොයිසි වටිනාකම්, ආපසු එවුම් වලට අදාල බැරපත් වටිනාකම්, ගැණුම්කරුගෙන් ලද මුදල් සහ තවදුරටත් අයවිය යුතු මුදල දක්වා යවනු ලබන ප්‍රකාශනය.
මෙම ප්‍රකාශනය යොදාගෙන ගැණුම්කරු තමන් ගෙවිය යුතු මුදල සහ සැපයුම්කරු පවසන අයවිය යුතු මුදල අතර සැසඳීමක් සිදු කරයි.

# ප්‍රේෂණ නිවේදනය


කිනම් ඉන්වොයිසි සඳහා ප්‍රියවීම් කරන්නේද, කිනම් බැරපත් හිලවි කරන්නේද යන විස්තර ඇතුලත් කරමින් ගැණුම්කරුවෙකු සැපයුම්කරුට යවන ලේඛනය. ප්‍රේෂණ නිවේදනය භාවිතා කර සැපයුම්කරු තම ගිණුම් යාවත්කාලීන කර ගනී.



20


JMC vLearning "your virtual learning partner"

# ලදුපත්



KOMSEKY (Pvt) LTD.

Tel : 0112 335 194
Fax : 0112 473 833
E-mail : komseky@gmail.com

143

No: 65/3,
Sir Chittampalam A. Gardiner Mawatha,
Colombo - 2

Date 2022.02.23

Received with thanks from J M C Jayasekera Management Centre (Pvt) Ltd
of
a sum of Rupees Twenty Six Thousand only
and cents Rs. 36,000/= on account of Annual Returns filing Charges and Returns Fees 2021


Rs. 36000/= Cash

All Cheques Subject to Realization,





# ලදුපත්



JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
163A
ARCHBISHOP NICHOLAS MARCUS M
NEAR THE MAIN BUS STAND
NEGOMBO

LANKA BELL
The truly Sri Lankan telecommunication company

OFFICIAL RECEIPT

Lanka Bell Ltd.
No. 344,
Galle Road,
Colombo 03,
Sri Lanka.
Tel : 011 5 335000

Date : 21-JUN-19
Receipt No. R7C/250174

Received with thanks from
a sum of Rupees
by as per details given below.

| Account No. | Narration | Amount |
| --- | --- | --- |
| 496716 | BILL | |
| | | 5,296.00 |

Cashier

Note : This receipt will be valid only after the realisation of the cheque / credit card





# ප්‍රාථමික පොත්






# ප්‍රාථමික පොත්




ගනුදෙනු සටහන් කරයි.




මූලාශ්‍ර ලියවිලි තුල අන්තර්ගත ගණුදෙනු සහ සිදුවීම් ප්‍රාථමිකව සටහන් කර තැබීමට භාවිතා වන පොත් ප්‍රාථමික සටහන් පොත් වේ.




25

දෛනිකව කරනු ලබන ණයට විකුණුම් මෙම පොතෙහි සටහන් කෙරේ.

## දෛනික විකුණුම් පොත

| දෛනික විකුණුම් පොතේ ආකෘතිය. | | | |
|---|---|---|---|
| දිනය | ඉන්වොයිස් අංකය | ගැණුම්කරු | මුළු ඉන්වොයිස් වටිනාකම රු. |
| 20X0/3/01 | 576 | ශාන්ත සමාගම | 12,000.00 |
| 20X0/3/01 | 577 | තිළිණ සමාගම | 10,000.00 |
| 20X0/3/01 | 578 | අරුණ සමාගම | 18,000.00 |
| 20X0/3/01 | 579 | රණතුංග සමාගම | 7,500.00 |
| | | | 47,500.00 |

Sandeepa Jayasekera - JMC 26

26

විකුණුම් විශ්ලේෂණය කිරීම සඳහා දෛනික විකුණුම් පොත භාවිතා කළ හැකිය.

## දෛනික විකුණුම් පොත

| දෛනික විකුණුම් පොතේ ආකෘතිය | | | | | |
|---|---|---|---|---|---|
| දිනය | ඉන්වොයිසි අංකය | ගැණුම්කරු | මුළු ඉන්වොයිස් වටිනාකම රු. | සබන් විකුණුම් රු. | ෂැම්පු විකුණුම් රු. |
| 20X0/3/01 | 576 | ශාන්ත සමාගම | 12,000.00 | 12,000.00 | |
| 20X0/3/01 | 577 | තිළිණ සමාගම | 10,000.00 | | 10,000.00 |
| 20X0/3/01 | 578 | අරුණ සමාගම | 18,000.00 | 10,000.00 | 8,000.00 |
| 20X0/3/01 | 579 | රණතුංග සමාගම | 7,500.00 | | 7,500.00 |
| | | | 47,500.00 | 22,000.00 | 25,500.00 |

Sandeepa Jayasekera - JMC 27

27

ව්‍යාපාරයක් නැවත විකිණීමේ පරමාර්ථයෙන් ණයට ගනු ලබන භාණ්ඩවල ඉන්වොයිසි වාර්තාකර තැබීමට භාවිතා කරයි. මෙයට අමතරව වෙනත් වියදම්වලට අදාල ඉන්වොයිසි ද වාර්තා කරයි.

## දෛනික ගැණුම් පොත

| දෛනික ගැණුම් පොතේ ආකෘතිය | | | | |
|---|---|---|---|---|
| දිනය | සැපයුම්කරු | මුළු ඉන්වොයිසි වටිනාකම රු. | ගැණුම් රු. | විදුලිය රු. |
| 20X0/3/03 | ඔරිගාමී සමාගම | 53,000.00 | 53,000.00 | |
| 20X0/3/03 | විදුලි මණ්ඩලය | 24,000.00 | | 24,000.00 |
| 20X0/3/03 | ගාර්ටන් සමාගම | 65,000.00 | 65,000.00 | |
| 20X0/3/03 | වෙල්ෂ් සමාගම | 8,000.00 | | 8,000.00 |
| | | 150,000.00 | 118,000.00 | 32,000.00 |

විවිධ සැපයුම්කරුවන්ගෙන් ලැබෙන ඉන්වොයිසි නිසා, ඉන්වොයිසි අංකය සඳහන් කිරීමට තීරුවක් නොමැත.

Sandeepa Jayasekera - JMC 28

28

ණයට කරන ලද විකුණුමක් ආපසු හරවා එවීමේදී සැපයුම්කරු බැර පතක් නිකුත් කරයි. එම බැරපත් මෙම පොත තුල වාර්තා කරයි.

## දෛනික විකුණුම් ආපසු එවුම් පොත

| දෛනික විකුණුම් ආපසු එවුම් පොතේ ආකෘතිය | | | |
|---|---|---|---|
| දිනය | බැරපත් අංකය | ගැණුම්කරු සහ භාණ්ඩ | වටිනාකම රු. |
| 20X0/3/05 | CR124 | අරුණ සමාගම<br>සමාගම කැට 50 | 5,000.00 |
| 20X0/3/06 | CR125 | රණතුංග සමාගම<br>ෂැම්පු 30 | 3,000.00 |
| | | | 8,000.00 |



ණයට ගත් භාණ්ඩ සැපයුම්කරු වෙත හරවා යැවීමේදී ගණුදෙනුකරුවන් හරපත් නිකුත් කරයි. විවධ ගැණුම්කරුවන්ගෙන් ලද හරපත් සටහන් කිරීමට මෙම පොත භාවිතා කරයි.

## දෛනික ගැණුම් ආපසු යැවුම් පොත

| දෛනික ගැණුම් ආපසු යැවුම් පොතේ ආකෘතිය | | |
|---|---|---|
| දිනය | ගැණුම්කරු සහ භාණ්ඩ | වටිනාකම රු. |
| 20X0/3/05 | ඔමේගා සමාගම<br>රබර් 2000Kg | 25,000.00 |
| 20X0/3/03 | ගාර්ටන් සමාගම<br>ලේටෙක්ස් රබර් 100Kg | 30,000.00 |
| | | 55,000.00 |



## මුදල් පොත



වාණිජ බැංකුවක විවෘත කරන ලද ජංගම ගිණුමක් තුලින් සිදුවන සියළුම මුදල් ලැබීම් සහ ගෙවීම් මෙහි සටහන් කරයි.

**මුදල් ලැබීම්** — ව්‍යාපාරයට ලැබෙන සියළුම මුදල් ලැබීම් ජංගම ගිණුම්වල තැන්පත් කරන අතර එම මුදල් ලැබීම් සහ ජංගම ගිණුමට සෘජුව ලැබෙන ප්‍රේෂණ සටහන් කරයි. මුදල් ලැබීම් තනි මුදල් පොතේ වම්පස තීරුවේ හෝ වෙනම් පොතක් ලෙස පවත්වාගත හැකිය.

**මුදල් ලැබීම්** — චෙක්පත් මගින් සහ සෘජු ප්‍රේෂණ වශයෙන් කරන සියළු ගෙවීම් මෙහි වාර්තා කරයි
මුදල් ගෙවීම් තනි මුදල් පොතේ දකුණු පස තීරුවේ හෝ වෙනම පොතක් ලෙස පවත්වාගත හැකිය

**සුළු මුදල්** — ව්‍යාපාරයේ සුළු වියදම් කළමනාකරණය කිරීමට මාසිකව තීරණය කළ මුදලක් සුළු මුදල් අග්‍රිමය ලෙස වෙන් කරයි. ඒ සඳහා මුදල් මාරු කිරීම මුදල් ගෙවීම් තුලින් සිදු කරයි.



## සියළු මුදල් ලැබීම්

## මුදල් ලැබීම්

| මුදල් පොත (ලැබීම් පැත්ත) | | |
|---|---|---|
| **දිනය** | **විස්තරය** | **එකතුව රු.** |
| 20X0/3/01 | ඉදිරියට ගෙන ආ ශේෂය | 10,000 |
| 20X0/3/03 | අත්පිට විකුණුම් | 25,000 |
| 20X0/3/05 | ණයගැති ලැබීම් - සුරෝෂ් | 12,000 |
| 20X0/3/10 | ණය - ලංකා බැංකුව | 100,000 |
| | | 147,000 |



JMC vLearning "your virtual learning partner"

මුදල් ලැබීම් විශ්ලෂණාත්මකව පහත පරිදි වාර්තා කළ හැකිය.

## මුදල් ලැබීම්

| මුදල් පොත (ලැබීම් පැත්ත) | | | | | |
|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | එකතුව රු. | ණයගැති ලැබීම් | අත්පිට විකුණුම් | වෙනත් |
| 20X0/3/01 | ඉදිරියට ගෙන ආ ශේෂය | 10,000 | | | |
| 20X0/3/03 | අත්පිට විකුණුම් | 25,000 | | 25,000 | |
| 20X0/3/05 | ණයගැති සුරෝෂ් | 12,000 | 12,000 | | |
| 20X0/3/10 | ණය-ලංකා බැංකුව | 50,000 | | | 50,000 |
| | | 97,000 | 12,000 | 25,000 | 50,000 |

Sandeepa Jayasekera - JMC 33

33

## සියළු මුදල් ගෙවීම්

## මුදල් පොත (ගෙවීම් පැත්ත)

| මුදල් පොත (ගෙවීම් පැත්ත) | | |
|---|---|---|
| **දිනය** | **විස්තරය** | **එකතුව රු.** |
| 20X0/3/1 | අත්පිට ගැණුම් | 5,000 |
| 20X0/3/1 | ණයහිමියන් - අක්බාර් සමාගම | 15,000 |
| 20X0/3/1 | ණයහිමියෝ - නිශා සමාගම | 15,000 |
| 20X0/3/1 | ණය - නැවත ගෙවීම් | 10,000 |
| 20X0/3/1 | සුළු මුදල් | 15,000 |
| 20X0/3/1 | ඉන්ධන වියදම් | 10,000 |
| 20X0/3/1 | ශේෂය/ප/ගෙ | 27,000 |

Sandeepa Jayasekera - JMC 34

34

සියළු මුදල් ගෙවීම් විශ්ලේෂණාත්මකව වාර්තා කළ හැකිය.

## මුදල් පොත (ගෙවීම් පැත්ත)

| මුදල් පොත (ගෙවීම් පැත්ත) | | | | | | |
|---|---|---|---|---|---|---|
| **දිනය** | **විස්තරය** | **එකතුව** | **ණයහිමි ගෙවීම්** | **සුළු මුදල්** | **අත්පිට ගැණුම්** | **වෙනත්** |
| 20X0/3/01 | අත්පිට ගැණුම් | 5,000 | | | 5,000 | |
| 20X0/3/01 | ණයහිමිගේ - අක්බාර් සමාගම | 15,000 | 15,000 | | | |
| 20X0/3/01 | ණයහිමිගේ - නිශා සමාගම | 15,000 | 15,000 | | | |
| 20X0/3/01 | ණය - නැවත ගෙවීම් | 10,000 | | | | 10,000 |
| 20X0/3/01 | සුළු මුදල් | 15,000 | | 15,000 | | |
| 20X0/3/01 | ඉන්ධන ගෙවීම් | 10,000 | | | | 10,000 |
| 20X0/3/01 | ශේෂය/ප/ගෙ | 27,000 | | | | |
| | | | 30,000 | 15,000 | 5,000 | 20.000 |

Sandeepa Jayasekera - JMC 35

35

## සුළු මුදල් පොත



ව්‍යාපාරයේ සියළු සුළු වියදම් ප්‍රධාන මුදල් තුලින් සිදු කිරීම අපහසුය. එමනිසා තීරණය කළ කාලයක් (මාසයක්) සඳහා වන සුළු වියදම් සිදු කිරීමට සුළු මුදල් අග්‍රිමයක් භාවිතා කරයි.

### අග්‍රිම ක්‍රමය

1. මාසික ඇතිවන සුළු වියදම් කළමනාකාරීත්ව ස්ථාවර මුදලක් තීරණය කරයි.
2. එය ප්‍රධාන මුදලින් සුළු මුදල් භාරකරුට ලබා දේ.
3. එම මුදලින් සුළු වියදම සිදු කරන අතර එම වියදම් වාර්තා සුළු පොතේ සටහන් කරයි.
4. මාසිකව සුළු මුදල් අග්‍රිමයේ වැය වූ වියදමට අදාල මුදල් ප්‍රධාන මුදල් තුලින් ලබා ගනී.
5. සෑමවිටකම සුළු මුදලින් කළ වියදම් සහ ඉතිරි මුදල් අග්‍රිමයට සමාන වේ.

pa Jayasekera - JMC 36

36

## සුළු මුදල් පොත

| ලැබීම් රු. | දිනය | විස්තරය | එකතුව රු. | ප්‍රවාහන රු. | සුහසාධන රු. | ලිපිද්‍රව්‍ය රු. | වෙනත් රු. |
|---|---|---|---|---|---|---|---|
| 10,000 | 1/9 | ඉ/ගෙ ශේෂය | | | | | |
| | 2/9 | කිරිපිටි | 1,500 | | 1,500 | | |
| | 2/9 | ප්‍රවාහන | 2,000 | 2,000 | | | |
| | 3/9 | පොත් | 1,000 | | | 1,000 | |
| | | ශේෂය ප/ගෙ | 5,500 | | | | |
| | | | 10,000 | 2,000 | 1,500 | 1,000 | |

Sandeepa Jayasekera - JMC 37


37

# ද්විත්ව සටහන් පොත් තැබීම සහ ගිණුම් තැබීම

Sandeepa Jayasekera - JMC 38

38

## සමස්ත ගිණුම්කරණ ක්‍රියාවලිය




Sandeepa Jayasekera - JMC 39

39

# පොදු ලෙජරය

Sandeepa Jayasekera - JMC 40

40

## පොදු ලෙජරය

ප්‍රධාන ගිණුම් ඇතුලත් වන ලෙජරය වේ.
ලෙජරය යනු තොරතුරු එකතුව වේ.

ප්‍රාථමික පොත්වල දෛනික එකතුව ⇨ පොදු ලෙජරයේ වාර්තා කරයි.

භාවිතයේ පහසුව සඳහා පොදු ලෙජරයේ කොටස් වලට කඩා කේත වශයෙන් නම් කරයි.

- [A] දේපල, පිරියත සහ උපකරණ (ජංගම නොවන වත්කම්)
- [B] දේපල, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය (වෙන්කිරීම්)
- [C] අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය (හිමිකම්)
- [D] තොග (ජංගම වත්කම්)
- [E] වෙළඳ ණයගැතියෝ (ජංගම වත්කම්)
- [F] වෙළඳ ණයහිමියෝ (ජංගම වගකීම්)
- [G] වැටුප් සහ වේතන (වියදම්)

Sandeepa Jayasekera - JMC 41

41

## ලෙජර් ගිණුමක ආකෘතිය

අලෙවිකරණ වියදම්

| දිනය | විස්තරය | යොමු අංකය | වටිනාකම | දිනය | විස්තරය | යොමු අංකය | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 15/4/X2 | විජය සමාගම | JP209 | 9,000 | | | | |

හර පැත්ත | බැර පැත්ත

42

# ගිණුම්කරණ සමීකරණය

Sandeepa Jayasekera - JMC 43

43

වත්කම් = ප්‍රාග්ධනය + වගකීම්




Sandeepa Jayasekera - JMC 44

44

JMC vLearning "your virtual learning partner"

| වත්කම් | − | වගකීම් | = | ප්‍රාග්ධනය |
|---|---|---|---|---|


**ශුද්ධ වත්කම සහ හිමිකම් දෙකම එකම අර්ථයක් ඇත.**



45

රු. 5,00000 ක් ආයෝජනය කරමින් මරියෝ පරිගණක අලෙවි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි.

| වත්කම් | = | ප්‍රාග්ධනය |
|---|---|---|
| මුදල් Rs.5,000,000 | = | හිමිකම් ප්‍රාග්ධනය Rs.5,000,000 |

 = 



46

රු. 2,500,000 ක් වැයකර ඔහු ගොඩනැගිල්ලක් සහ රු. 2,000,000 ක් වැය කර පරිගණක තොගයක් මිලට ගන්නා ලදි.

| වත්කම් | = | ප්‍රාග්ධනය |
|---|---|---|
| ගොඩනැගිලි රු.2,500,000 | | හිමිකම් ප්‍රාග්ධනය රු.5,000,000 |
| තොග රු.2,000,000 | = | |
| මුදල් රු.500,000 | | |



47

මාරියෝ විසින් පරිගණක තොගය රු. 3,000,000 කට විකුණා රු. 1,000,000 ක ලාභයක් උපයා ගන්නා ලදි

| වත්කම් | = | ප්‍රාග්ධනය |
|---|---|---|
| ගොඩනැගිලි රු.2,500,000 | | හිමිකම් ප්‍රාග්ධනය රු.5,000,000 |
| තොග | = | රඳවාගත් ලාභය රු.1,000,000 (3,000,000 – 2,000,000) |
| මුදල් රු.3,500,000 (500,000 + 3,000,000) | | |



48

JMC vLearning your virtual learning partner

### මාරියෝ විසින් රු. 200,000 ක ගැනිලි සිදු කරන ලදි.

| වත්කම් | = | ප්‍රාග්ධනය |
|---|---|---|
| ගොඩනැගිලි රු.2,500,000 | = | හිමිකම් ප්‍රාග්ධනය රු.5,000,000 |
| තොගය - | | රඳවාගත් ලාභය රු.1,000,000 |
| මුදල රු.3,300,000 (3,500,000 – 200,000) | | (-) ගැනිලි (-) රු.200,000 |

Sandeepa Jayasekera - JMC 49

49

### මාරියෝ විසින් රු. 1,000,000 ක පරිගණක ණය පදනම මත ලබා ගන්නා ලදි.

| වත්කම් | = | ප්‍රාග්ධනය | + | වගකීම් |
|---|---|---|---|---|
| ගොඩනැගිලි රු.2,500,000 | = | හිමිකම් ප්‍රාග්ධනය රු.5,000,000 | + | ණයහිමියෝ රු.1,000,000 |
| තොගය රු.1,000,000 | | රඳවාගත් ලාභය රු.1,000,000 | | |
| මුදල් රු.3,300,000 | | (-) ගැනිලි (-) රු.200,000 | | |

Sandeepa Jayasekera - JMC 50

50

### මාරියෝ විසින් රු. 500,000 ක් නැවත ව්‍යාපාරයට ආයෝජනය කරන ලදි. තවද රු. 600,000 ක ණය මුදලක් ලබා ගන්නා ලදි. රු. 400,000 ක් වූ පරිගණක රු. 750,000 කට අලෙවිකරණ ලදි.

| වත්කම් | = | ප්‍රාග්ධනය | + | වගකීම් |
|---|---|---|---|---|
| ගොඩනැගිලි රු.2,500,000 | = | හිමිකම් ප්‍රාග්ධනය රු.5,500,000 | + | ණයහිමියෝ රු.1,000,000 |
| තොගය රු.500,000 | | රඳවාගත් ලාභය රු.1,350,000 (1,000,000+350,000) | | ණය රු.500,000 |
| මුදල් රු.5,150,000 (3,300,000 + 500,000 + 600,000 + 750,000) | | (-) ගැනිලි (-) රු.200,000 | | |

Sandeepa Jayasekera - JMC 51

51

### ගිණුම්කරණ සමීකරණය

වත්කම් = ප්‍රාග්ධනය + ලාභය + වගකීම්

වත්කම් = ප්‍රාග්ධනය + ආදායම් − වියදම් + වගකීම්

වත්කම් + වියදම් = ප්‍රාග්ධනය + ආදායම් + වගකීම්

Sandeepa Jayasekera - JMC 52

52

JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න 01

පහත ගණුදෙණු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.

1..1 රු. 1,000,000 ක් ආයෝජනය කර ව්‍යාපාරය ආරම්භ කරන ලදි.

1.2 රු. 500,000 ක ණයක් ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලදි.

1.3 රු. 800,000 ක් වටිනා ණයට ගැනුම් සිදු කරන ලදි.

1.4 රු. 600,000 ක් සැපයුම්කරුවන්ට ගෙවන ලදි.

1.5 රු. 10,000 ක මුදල් සහ රු. 10,000 ක තොග ගැනිලි සිදු කරන ලදි.

Sandeepa Jayasekera - JMC 53

53

## ප්‍රශ්න 01

1.6 රු.450,000 ක් පිරිවැය පිරිවැය වූ තොග රු.650,000 කට ණය පදනමට අලෙවි කරන ලදි.

1.7 රු. 300,000 ක් ණයගැතියන්ගෙන් ලැබී ඇත.

1.8 රු. 25,000 ක් වූ දුරකථන බිල ගෙවන ලදි.

1.9 රු. 50,000 ක් වූ වැටුප් වියදමින් රු. 25,000 ක් මුදලින් ගෙවූ අතර ඉතිරිය උපචිත විය.

1.10 රු. 200,000 ක දේපල පිරියත උපකරණ මිල දී ගන්නා ලදි.

Sandeepa Jayasekera - JMC 54

54

# ද්විත්ව සටහන් ගිණුම් තැබීම

Sandeepa Jayasekera - JMC 55

55

## ද්විත්ව බලපෑම

සෑම ගණුදෙනුවකම සමාන වටිනාකමක් ඇති එකිනෙකට ප්‍රතිවිරුද්ධ බලපෑම් දෙකක් ඇත. එම බලපෑම එකක් හර ලෙසත් අනෙක බැර ලෙසත් ගිණුම් වාර්තා තුල හඳුනා ගැනේ.



56

JMC vLearning "your virtual learning partner"

## ද්විත්ව බලපෑමට උදාහරණ

| | |
|---|---|
| රු. මිලියන 5 ක් වැයකර මෝටර් රථයක් මිලට ගැනීම | • රු. මිලියන 5 කින් වාහන වත්කම වැඩි වේ<br>• රු. මිලියන 5 කින් මුදල් වත්කම අඩු වේ. |
| රු. මිලියන 10 ක බැංකු ණයක් ලබා ගැනීම | • රු. මිලියන 10 කින් මුදල් වත්කම වැඩි වේ<br>• රු. මිලියන 10 කින් ණය වගකීම වැඩි වේ. |
| රු. මිලියන 2 ක අලෙවිකරණ වියකමක් දැරීම | • රු. මිලියන 2 කින් අලෙවිකරණ වියදම වැඩි වේ<br>• රු. මිලියන 2 කින් මුදල් වත්කම අඩු වේ. |

57

57

## ද්විත්ව සටහන්

| අයිතමය | වැඩිවීම | අඩුවීම |
|---|---|---|
| වත්කම් | හර | බැර |
| වියදම් | හර | බැර |
| හිමිකම් | බැර | හර |
| ආදායම් | බැර | හර |
| වගකීම් | බැර | හර |

58

58

## ගිණුම්කරණ සමීකරණය සහ හැර බැර සම්බන්ධතාවය

හර = බැර

වත්කම් + වියදම් = ප්‍රාග්ධනය + ආදායම් + වගකීම්

Sandeepa Jayasekera - JMC

59

59

## ලෙජර් ගිණුම




තොරතුරු සටහන් කරයි



LEDGER

Sandeepa Jayasekera - JMC

60

60

JMC vLearning "your virtual learning partner"


## ලෙජර් ගිණුම සහ ද්විත්ව බලපෑම

ලෙජරය යනු භෞතිකව හෝ විද්‍යුත් මාධ්‍යයෙන් තබා ගන්නා ගිණුම් එකතුවකි. ව්‍යාපාරයක සියළුම ගණුදෙනුවල ද්විත්ව බලපෑම හර සහ බැර ලෙස ලෙජර් ගිණුම්වල වාර්තා කරනු ලැබේ.

| හර | බැර |
| --- | --- |
| | |

61

61




62

## ප්‍රශ්න 02

පහත ගණුදෙනුවල ද්විත්ව සටහන් තීරණය කර T ගිණුම්වල දක්වන්න.

2.0 රු. 2,000,000 ක් ආයෝජනය කර ව්‍යාපාරය ආරම්භ කරන ලදි.

2.1 රු. 100,000 ක ණයට විකුණුම්

2.2 10% ක වට්ටමක් ලද ණයගැතියා විසින් රු. 80,000 ක ණය මුදල පියවීම

2.3 ණයට ගැණුම් රු. 50,000

2.4 රු. 40,000 ක ණයහිමි ශේෂය පියවීමේදි 5% ක මුදල් වට්ටමක් ලැබී ඇත.

2.5 රු. 75,000 ක මුළු වැටුපෙන් රු. 50,000 ක මුදලින් ගෙවන ලදි. ඉතිරිය ගෙවිය යුතුව ඇත.

2.6 රු. 40,000 ක උපකරණ බැංකු ණයක් තුලින් ලබාගෙන ඇත.

Sandeepa Jayasekera - JMC

63

63

## ප්‍රශ්න 02

2.7 උපකරණය අළුත්වැඩියාවට රු. 2,000 ක් වැය වී ඇත. මෙය තවමත් ගෙවා නොමැත.

2.8 රු. 5,000 ක පොලී ආදායමක් ලැබී ඇත.

2.9 රු. 10,000 ක ගැණුම් සැපයුම්කරුට හරවා යවා ඇත.

2.10 රු. 20,000 ක විකුණුම් ආපසු එවුම්.

2.11 රු. 50,000 ක ගැනිලි සිදු කරන ලදි.

2.12 රු. 60,000 ක ගොඩනැගිලි කුලී ගෙවිය යුතු වේ.

2.13 උපකරණ ක්ෂය රු. 5,000 කි.

Sandeepa Jayasekera - JMC

64

64

JMC vLearning
"your virtual learning partner"

# ණයගැති සහ ණයහිමි ලෙජරය

Sandeepa Jayasekera - JMC 65

65

## පෞද්ගලික සහ අපෞද්ගලික ගිණුම්

| පොදු ලෙජරය | උප ලෙජර (ණයගැති ලෙජරය / ණයහිමි ලෙජරය) |
|---|---|
| අපෞද්ගලික ගිණුම් | පෞද්ගලික ගිණුම් |
| පොදු ලෙජරය තුල වියදම, වත්කම්, ආදායම්, හිමිකම සහ වගකීම් ගිණුම විවෘත කර ගණුදෙනු වාර්තා කරයි. මෙම ගිණුම් පෞද්ගලික නොවන අතර පොදු ගිණුම වේ. එමනිසා පොදු ලෙජරයේ ගිණුම් අපෞද්ගලික නොවන අතර පොදු ගිණුම් වේ. එමනිසා පොදු ලෙජරයේ ගිණුම් අපෞද්ගලික ලෙස සලකයි. | ණයගැතියන් සහ ණයහිමියන් එකිනෙකා වෙන වෙනම හඳුනාගෙන ගිණුම් වාර්තා පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ. එමනිසා ණයගැතියන්ට වෙනම සහ ණයහිමියන්ට වෙනම පෞද්ගලික ලෙජර පවත්වාගෙන යනු ලබයි. මෙම ගිණුම් සඳහා ද්විත්ව සටහන් න්‍යාය පදනම් නොවන අතර මේවා හුදෙක් සිහිවටන ගිණුම් වේ. |

Sandeepa Jayasekera - JMC 66

66

## ණයගැති ලෙජරය

- දෛනික විකුණුම් පොතේදී දින අනුපිළිවෙලට විකුණුම් ඉන්වොයිසි වාර්තා කරයි. එකී එකතුව පොදු ලෙජරය තුල වාර්තා කරයි.
- ඒ ඒ ණයගැතියා වෙනුවෙන් වෙන වෙනම පෞද්ගලික ලෙජරයක් පවත්වා ගැනීමට අත්‍යාවශ්‍ය වේ. එයට හේතු වන්නේ,
  - එක් එක් ණයගැතියාගෙන් අයවිය යුතු ප්‍රමාණය ගණනය කරන්න.
  - මාසය අවසානයේ පාරිභෝගිකයන්ට ණයගැති ප්‍රකාශන යැවීමට
  - ණය සීමාවන් පරීක්ෂා කිරීමට
  - ලද මුදල් සහ ණයගැතිභාවය සසඳා බැලීමට

පාරිභෝගිකයන්ගේ පෞද්ගලික ගිණුම්



Sandeepa Jayasekera - JMC 67

67

## ණයගැති ලෙජරය

ඉන්වොයිසි → දෛනික විකුණුම් පොත → ණයගැති ලෙජරයේ හර පැත්ත

මුදල් ලැබීම් → මුදල් පොත → ණයගැති ලෙජරයේ බැර පැත්ත

සෑම ණයගැතියෙකු සඳහාම කේතයක් ලබාදෙන අතර එම කේතය දෛනික විකුණුම් පොතේ දක්වනු ලැබේ.

Sandeepa Jayasekera - JMC 68

68

# ණයගැති ලෙජරයේ ආකෘතිය

iyka iud.u

| දිනය | විස්තරය | අනු අංකය | රු. | දිනය | විස්තරය | අනු අංකය | රු. |
|---|---|---|---|---|---|---|---|
| 01/01/X1 | ඉදිරියට ගෙන ආ ශේෂය | | 90,000 | 20/01/X1 | මුදල් | | 190,000 |
| 10/01/X1 | විකුණුම් | SDB 24 | 200,000 | 31/01/X1 | ශේෂය ප/ගෙ | | 100,000 |
| | | | 290,000 | | | | 290,000 |
| 01/02/X1 | ඉදිරියට ගෙන ආ ශේෂය | | 100,000 | | | | |



# ණයහිමි ලෙජරය

- දෛනික ගැණුම් පොත තුල ණයට ගැණුම් පිළිබඳ තොරතුරු දින අනුපිළිවෙලට වාර්තා කරයි. එහි සාරාංශය පොදු ලෙජරය තුල වාර්තා කරයි.
- ඒ ඒ ණයහිමියන් වෙනුවෙන් වෙන වෙනම පෞද්ගලික ගිණුම් ණයහිමි ලෙජරය තුල පවත්වා ගනී. මෙයට හේතු වන්නේ,
  - ඒ ඒ ණයහිමියාගේ ගෙවිය යුතු ශේෂය වෙනම හඳුනා ගැනීමට
  - ණය සීමාවන් පරීක්ෂා කිරීමට
  - ගෙවූ මුදල් ගෙවිය යුතු මුදල් සමඟ සංසන්දනය කිරීමට

සැපයුම්කරුවන්ගේ පෞද්ගලික ගිණුම්





# ණයහිමි ලෙජරය

ඉන්වොයිසි → දෛනික ගැණුම් පොත් → ණයහිමි ලෙජරයේ බැර පැත්ත

මුදල් ගෙවීම් → මුදල් පොත → ණයහිමි ලෙජරයේ හර පැත්ත

එක් එක් සැපයුම්කරු සඳහා කේතයක් ඇති අතර එය දෛනික ගැණුම් පොතේ සඳහන් කරයි.



# ණයහිමි ලෙජරයේ ආකෘතිය

ටෙස්කෝ සමාගම

| දිනය | විස්තරය | අනු අංකය | රු. | දිනය | විස්තරය | අනු අංකය | රු. |
|---|---|---|---|---|---|---|---|
| 25/01/X1 | මුදල් | | 250,000 | 01/01/X1 | ශේෂය ඉ/ගෙ | | 50,000 |
| 31/01/X1 | ශේෂය ප/ගෙ | | 100,000 | 15/01/X1 | ගැණුම් | PDB 13 | 300,000 |
| | | | 350,000 | | | | 350,000 |
| | | | | 01/02/X1 | ශේෂය ප/ගෙ | | 100,000 |



JMC vLearning "your virtual learning partner"

# පාලන ගිණුම්





## මොකක්ද මේ පාලන ගිණුම් කියන්නේ

උප ලෙජරයේ තියෙන තනි තනි ගිණුම් සමූහයක් වෙනුවෙන් පොදු ලෙජරයේ පවත්වාගෙන යන ගිණුම

උදා


- ණයගැති පාලන ගිණුම
- ණයහිමි පාලන ගිණුම





## පාලන ගිණුම්වල ගනුදෙනු වාර්තා කරන්නේ කොහොමද?








## උදාහරණ

සුමනා ව්‍යාපාරය විසින් පහත ණයට විකුණුම් සිදු කර ඇත

දයාවතීට රු 50,000ක්
සීලවතීට රු 40,000ක්
සිරියාවතීට රු 25,000ක්

පහත සඳහන් පරිදි ණයගැතියන්ගෙන් මුදල් ලැබී ඇත

දයාවතීගෙන් රු 30,000ක්
සීලවතීගෙන් රු 20,000ක්
සිරියාවතීගෙන් රු 20,000ක්



JMC vLearning "your virtual learning partner"

# පොදු ලෙජරය

**ණයගැති පාලන**

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 115,000 | මුදල් | 70,000 |
| | | ශේෂය ප/ගෙ | 45,000 |
| | 115,000 | | 115,000 |
| ශේෂය ඉ/ගෙ | 45,000 | | |

**විකුණුම්**

| | | | |
|---|---|---|---|
| ලාභාලාභ | 115,000 | ණයගැති පාලන | 115,000 |
| | 115,000 | | 115,000 |

**මුදල්**

| | | | |
|---|---|---|---|
| ණයගැති පාලන | 70,000 | ශේෂය ප/ගෙ | 70,000 |
| | 70,000 | | 70,000 |
| ශේෂය ඉ/ගෙ | 70,000 | | |

77

# පෞද්ගලික ලෙජර - ණයගැති ලෙජරය

**දයාවතී**

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 50,000 | මුදල් | 30,000 |
| | | ශේෂය ප/ගෙ | 20,000 |
| | 50,000 | | 50,000 |
| ශේෂය ඉ/ගෙ | 20,000 | | |

**සිරියාවතී**

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 25,000 | මුදල් | 20,000 |
| | | ශේෂය ප/ගෙ | 5,000 |
| | 25,000 | | 25,000 |
| ශේෂය ඉ/ගෙ | 5,000 | | |

**සීලවතී**

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 40,000 | මුදල් | 20,000 |
| | | ශේෂය ප/ගෙ | 20,000 |
| | 40,000 | | 40,000 |
| ශේෂය ඉ/ගෙ | 20,000 | | |

| | |
|---|---|
| දයාවතී | 20,000 |
| සීලවතී | 20,000 |
| සිරියාවතී | 5,000 |
| ණයගැති ලෙජර එකතුව | 45,000 |
| පොදු ලෙජරයේ ණයගැති පාලන ගිණුම | 45,000 |

ඕනෑම අවස්ථාවක පාලන ගිණුමේ ශේෂය සහ ණයගැති ලෙජර ගිණුම්වල ශේෂ එකතුව සමාන විය යුතු වේ

78

# පාලන ගිණුම් සහ ලෙජරය

**මූලාශ්‍ර ලේඛණ**

- සමන්ට ණයට විකුණුම් රු 100
- කමල්ට ණයට විකුණුම් රු 200
- සමන්ගෙන් මුදල් ලැබුණා රු 110
- කමල්ගෙන් මුදල් ලැබුණා රු 150

**මූලික පොත්**

දෛනික විකුණුම් පොත

| | |
|---|---|
| සමන් | 100 |
| කමල් | 20 |
| **එකතුව** | **300** |

මුදල් පොත

| | |
|---|---|
| සමන්ගෙන් | 110 |
| කමල්ගෙන් | 150 |
| **එකතුව** | **260** |

ණයගැති පුද්ගලික ලෙජරය

සමන්

| | | | |
|---|---|---|---|
| විකු | 100 | මුදල් | 110 |
| ශේෂය | 10 | | |

කමල්

| | | | |
|---|---|---|---|
| විකු | 200 | මුදල් | 150 |
| | | ශේෂය | 50 |

| | | |
|---|---|---|
| සමන් | 10 | බැර |
| කමල් | 50 | හර |
| එකතුව | 40 | හර |

**පොදු ලෙජරය**

විකුණුම් ගිණුම

| | | | |
|---|---|---|---|
| | | ණයගැති පාලන | 300 |

ණයගැති පාලන

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 300 | මුදල් | 260 |
| | | ශේෂය | 40 |

මුදල් ගිණුම

| | | | |
|---|---|---|---|
| ණයගැති පාලන | 260 | | |

79

# ප්‍රශ්න 03

20X2 ජූලි 01 දිනට විළාර සමාගමට වෙළඳ ලැබිය යුතු දෑ නොතිබුණි. ජූලි මාසය තුල පහත සඳහන් ණයට විකුණුම් සහ ගනුදෙනුකරුවන්ට බලපාන ගනුදෙනු සිදු විය.

1. ජූලි 3 ලෝහ භාණ්ඩ ගැමුණු වෙත ණයට විකිණීම සඳහා ඉන්වොයිසි නිකුත් කරන ලදි.
2. ජූලි 11 රු 150ක විදුලි භාණ්ඩ විකිණීම සඳහා තිස්ස වෙත ඉන්වොයිසි නිකුත් කරන ලදි.
3. ජූලි 15 රු 250ක ලෝහ භාණ්ඩ විජය වෙත ණයට විකිණීමට ඉන්වොයිස් නිකුත් කරන ලදි.
4. ජූලි 10 රු 90ක චෙක්පතක් ගැමුණු විසින් ගෙවන ලදි විකුණු දින සිට දින 7ක් තුල ගෙවීම් කළ බැවින් ගැමුණුට 10%ක වට්ටමක් ලබා දෙන ලදි.
5. ජූලි 18 රු 80ක් වූ ණය ශේෂය පියවන්න, තිස්ස කටයුතු කරන ලද අතර 8%ක වට්ටමක් හිමිවේ.

80

JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න 03

6. විජය විසින් ජූලි 28 රු 120ක් ගෙවූ අතර කිසිදු වට්ටමක් ලැබී නැත.

පහත යොමු අංක භාවිතා කරමින් මෙම ගනුදෙනු මූලික පොත්, පොදු ලෙජරයේ සහ පෞද්ගලික ලෙජර තුල වාර්තා වන ආකාරය පෙන්වන්න

RL1 ගැමුණුගේ ණයගැති පෞද්ගලික ගිණුම

RL2 තිස්සගේ ණයගැති පෞද්ගලික ගිණුම

RL3 විජයගේ ණයගැති පෞද්ගලික ගිණුම

GL1 බැංකු මුදල් ගිණුම

GL2 ණයගැති පාලන ගිණුම

GL3 දුන් වට්ටම් ගිණුම

GL4 ලෝහ භාණ්ඩ විකුණුම් ගිණුම

GL5 විදුලි උපකරණ විකුණුම් ගිණුම

81

## ඇයි අපට පාලන ගිණුම් ඕනි වෙන්නේ?



### නිවැරදිබව තහවුරු කරන්න

- පෞද්ගලික ලෙජරවල ගිණුම් සටහන් දාන කොට පහල තියන දෝෂ ඇති වෙන්න පුළුවන්
  - මාරුවීම් දෝෂ
  - අත්හැරීම් දෝෂ
  - පිටපත් කිරීම් දෝෂ
  - ගණනය කිරීම් දෝෂ
- පාලන ගිණුම් සහ පෞද්ගලික ලෙජර ගිණුම් සසඳලා ඒ වැරදි හොයාගන්න පුළුවන්

82

## ඇයි අපට පාලන ගිණුම් ඕනි වෙන්නේ?

### වරද සිදු වූ ස්ථානය හඳුනාගන්න

ඉන්වොයිසි, ගෙවීම් සටහන් කිරීමේ වරදක් හරි පිළිවෙල මාරු වීම් වරදක් තිබුණොත් පාලන ගිණුම් දෛනිකව හරි, සතිපතා හරි මාසිකව හරි හදනකොට හඳුනාගන්න පුළුවන්



83

## ඇයි අපට පාලන ගිණුම් ඕනි වෙන්නේ?



### අභ්‍යන්තර පරීක්ෂාවක් විදිහට

- පාලන ගිණුම්වල ගිණුම් සටහන් තියන එකයි පෞද්ගලික ලෙජරවල ගිණුම් සටහන් තියන එකයි ගිණුම් ලිපිකරුවෝ දෙන්නෙක් කරන්නේ
- පාලන ගිණුම් සහ පෞද්ගලික ලෙජර සසඳද්දි දෙදෙනාගේ ගිණුම් සටහන් පරීක්ෂා වෙනවා

84

JMC vLearning
"your virtual learning partner"

# ඇයි අපට පාලන ගිණුම් ඕනි වෙන්නේ?

**ඉක්මණින් මූලය ප්‍රකාශ හදන්න**

පෞද්ගලික ලෙජර ශේෂ කරලා එකතුව අරන් ශේෂ පිරික්සුම හදනවාට වඩා ඉක්මණින් පාලන ගිණුම ශේෂ කරලා ශේෂ පිරික්සුම හදන එක ඉක්මන්




85

# ප්‍රශ්න 04

20X7 අප්‍රේල් 01 දිනට සහේලි සමාගමේ ණයගැති පාලන ගිණුමේ ශේෂය රු 8,024,000ක් හරට සහ රු 57,000ක බැර ශේෂයක්ද ණයහිමි පාලන ගිණුමේ රු 6,235,000ක බැර ශේෂයක් සහ රු 105,000ක හර ශේෂයක්ද පැවතිණි. 20X8 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු පවතී.

| | |
|---|---|
| විකුණුම් | 63,728,000 |
| මිලදී ගැනුම් | 39,974,000 |
| ණයගැති මුදල් ලැබීම් | 55,212,000 |
| ණයහිමි මුදල් ගෙවීම් | 37,307,000 |
| ලද වට්ටම් | 1,475,000 |
| දුන් වට්ටම් | 2,328,000 |

86

# ප්‍රශ්න 04

| | |
|---|---|
| ආපසු එවුම් | 1,002,000 |
| ආපසු යැවුම් | 535,000 |
| අයකරගත නොහැකි ණය සහ කපා හැරීම් | 326,000 |
| ණයහිමි ලෙජරයේ හර ශේෂයන් වෙනුවෙන් ලද මුදල් | 105,000 |
| භාණ්ඩ ප්‍රවාහනයේදී සිදු වූ අලාභ වෙනුවෙන් ගනුදෙනුකරුවන්ට දීමනා | 212,000 |

20X8 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයගැති සහ ණයහිමි පාලන ගිණුම් පිළියෙල කරන්න.

87

# ප්‍රති සටහන්

- එකම පුද්ගලයා හෝ ආයතනය ණයහිමි සහ ණයගැති ශේෂ දෙකේම ඉන්න පුළුවන්
- ඒ ශේෂ එකිනෙක හිලව් කරන්න එකඟතාවයකට අවොත් ප්‍රති සටහන් දාලා ශේෂ හිලව් කරන්න පුළුවන්



ණයහිමි හර
ණයගැති බැර

88

JMC vLearning "your virtual learning partner

## ප්‍රශ්න 05

ණයහිමි පාලන ගිණුමක පහත සටහන් ඇතුලත් වේ

බැංකු 79,500
ණයට ගැනුම් 83,200
ලද වට්ටම් 3,750
ණයගැති පාලන ගිණුමට ප්‍රති සටහන් 4,000
20X8/12/31 දිනට ශේෂය ප/ගෙ

20X8/1/1 දින ඉදිරියට ගෙන ආ ශේෂය ගණනය කරන්න

89

## වට්ටම්




| වෙළඳ වට්ටම් | මුදල් වට්ටම් |
|---|---|

90

## ප්‍රශ්න 06

රොනී සමාගම එකක් රු 20,000 බැගින් වූ ජංගම දුරකථන 10ක් සෝනි සමාගමෙන් ණයට ගන්නා ලදි. එහිදී 10% වට්ටමක් හිමි විය. ණය මුදල දින 14ක් තුල ගෙවීම් කලහොත් 5% ක වට්ටමක් හිමිවේ.

රොනී සමාගම පැත්තෙන් මෙම වට්ටම් මොනවාද? වට්ටමේ වටිනාකම සහ ගිණුම් තැබිය යුතු ආකාරය දක්වන්න.

සෝනි සමාගම පැත්තෙන් මෙම වට්ටම් මොනවාද? වට්ටමේ වටිනාකම සහ ගිණුම් තැබිය යුතු ආකාරය දක්වන්න.

91

## වට්ටම්

| | වෙළඳ වට්ටම් | මුදල් වට්ටම් |
|---|---|---|
| කියන්නේ | භාණ්ඩ මිලදී ගන්න කොට ලැයිස්තුගත මිලෙන් අඩු කරන ප්‍රමාණය. සාමාන්‍යයෙන් විශාල තොගයක් ගන්නකොට විකුණුම්කරු වෙළඳ වට්ටමක් ලබා දෙනවා | නියමිත කාලය ඇතුලේ හෝ නියමිත කාලයට කලින් ණයට විකුණුමක මුදල් පියවද්දි, කලින් ණය ගෙවන එක දිරිමත් කරන්න ණයෙන් අඩු කරන ප්‍රමාණය |
| ලද වට්ටම් ගිණුම් තියන විදිහ | ගැනුම් වටිනාකම විදිහට ගන්න ඕනි වට්ටම අඩු කරාට පස්සේ එන වටිනාකම | ලද වට්ටම වෙනත් ආදායමක් විදිහට ගිණුම් තියනවා |
| දුන් වට්ටම් ගිණුම් තියන විදිහ | විකුණුම් වටිනාකම විදිහට ගන්න ඕනි වට්ටම අඩු කරාට පස්සේ එන වටිනාකම | දුන් වට්ටම බෙදාහැරීම් වියදමක් විදිහට ගිණුම් තියනවා |

92

JMC vLearning "your virtual learning partner"


## ප්‍රශ්න 07

පහත දී ඇති තොරතුරු අනුව ඔබ විසින් සීසෝ දැව වෙළඳ ආයතනයේ 20X9 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම් පිළියෙළ කරන්න

| | |
|---|---|
| දළ ගැනුම් පිරිවැය | 240,000 |
| ලද වෙළඳ වට්ටම් | 8,000 |
| ලද මුදල් වට්ටම් | 3,000 |
| මුදලට විකුණුම් | 68,000 |
| ඉන්වොයිසි මිලට ණයට විකුණුම් | 300,000 |
| දුන් මුදල් වට්ටම් | 16,000 |
| විකුණුම් වියදම් | 64,000 |
| පරිපාලන වියදම් | 80,000 |
| ගැනිලි | 44,000 |

93

## පාලන ගිණුම් තුලනය කිරීම සහ ණයගැති සහ ණයහිමි ලෙජර සමග එකඟ කිරීම




94

| වෙනස්කම් ඇති වීමට හේතු | නිවැරදි කිරීම |
|---|---|
| මූලික පොත්වල එකතු වැරදීම<br>මේ නිසා පාලන ගිණුමට වැරදි අගයක් වාර්තා වීම | පොදු ජර්නලයේ ද්විත්ව සටහනක් දැමිය යුතු වේ |
| මාරු වීමේ වැරදි<br>ණයගැතියෙකුට හෝ ණයහිමියෙකුට නිවැරදි ප්‍රමාණය පොදු ලෙජරයේ වාර්තා වුණත්, ණයගැති සහ ණයහිමි ලෙජරවල වැරදි අගයක් වාර්තා වීම | පෞද්ගලික ලෙජර ගිණුම නිවැරදි කළ යුතු වේ |
| අත්හැරීම්<br>ගනුදෙනුවක් පාලන ගිණුමේ සටහන් වෙලා පෞද්ගලික ලෙජරයේ වාර්තා නොවී තියෙන්න හෝ පෞද්ගලික ලෙජරයේ වාර්තා වෙලා පොදු ලෙජරයේ වාර්තා නොවී තියෙන්න පුළුවන් | පොදු ලෙජරයේ අත්හැරිලා තිබ්බොත් ද්විත්ව සටහන දාන්න ඕනි පෞද්ගලික ලෙජරයේ අත්හැරිලා තිබ්බොත් තනි සටහනක් ඕනි |
| එකතූන් වැරදීම<br>ශේෂ එකතූන් හෝ පාලන ගිණුමේ එකතුව වැරදීම | එකතූන් නිවැරදි කළ යුතුය |

95

## ප්‍රශ්න 08

සමාගමේ ලැබිය යුතු එක් එක් ශේෂවල එකතුව ලැබිය යුතු පාලන ගිණුමේ හර ශේෂයට වඩා රු.800ක් වැඩිය. පහත සඳහන් වැරදිවලින් කුමක් ඉහත වෙනස සඳහා හේතු වේද?

A. දෛනික විකුණුම් පොත රු.800ක් අඩුවෙන් එකතු කර ඇත
B. රු.800ක දුන් වට්ටමක් පොදු ලෙජරයෙන් ඉවත් වී ඇත
C. රු.800ක ලැබිය යුතු ලෙජරයේ බැර ශේෂයක් හර ශේෂයක් ලෙස සලකා ඇත
D. ලැබීම් මුදල් පොත රු.800ක් අඩුවෙන් එකතු කර ඇත

96

## පාලන ගිණුම් ශේෂ සහ පෞද්ගලික ලෙජර එකඟ කිරීමේ පියවර

| | |
|---|---|
| පියවර 01 | පෞද්ගලික ලෙජර සහ පාලන ගිණුමේ ශේෂ සංසන්දනය කරලා වෙනස්කම් හඳුනාගන්න |
| පියවර 02 | පෞද්ගලික ලෙජරවල තිබෙන වැරදි නිවැරදි කරන්න |
| පියවර 03 | ගැලපීමට පෙර පාලන ගිණුමේ ශේෂයෙන් පටන් අරන් පාලන ගිණුමට නිවැරදි කිරීම් සටහන් දාලා නිවැරදි කරන්න |

97

## ප්‍රශ්න 09

20X6 දෙසැම්බර් 31 දිනට ශාන්ත සමාගමේ ගෙවිය යුතු පාලන ගිණුමේ ශේෂය රු.12,500කි. කෙසේ වෙතත් ගෙවිය යුතු ලෙජරයේ එක් එක් ශේෂයන්ගේ උපුටාගත් එකතුව රු.12,800කි. පරීක්ෂා කිරීමේදී පහත වැරදි සොයා ගැනුනි. වර්ෂයේ අවසාන සතියේදී මිලදී ගත් රු.1,200ක මිලදී ගැනීම් පාලන ගිණුමෙන් මග හැරී ඇත. රු.900ක ශේෂයක් ඇති ගනුදෙනුකරුවෙක්ගේ ගිණුමක් ලැයිස්තුවෙන් අත්හැරී ඇත.

A. රු.12,500
B. රු.13,400
C. රු.12,800
D. රු.13,700

98

## සැපයුම්කරුගේ ප්‍රකාශය

- මාසයක් පුරාවට කරපු ණයට විකුණුම්, ලද මුදල්, දුන් වට්ටම් ඇතුලත් කරලා විකුණුම්කරුවෙක් ණයගැතියෝන්ට මාසික ප්‍රකාශයක් යවනවා. ඒකට කියනවා සැපයුම්කරුගේ ප්‍රකාශය කියලා.
- ඒ ප්‍රකාශය ලැබුණාම ණයහිමි ලෙජරයේ තියන පුද්ගලික ගිණුමත් එක්ක සංසන්දනය කරලා වෙනස්කම් හඳුනාගන්න ඕනි. ඒ වගේම වැරදි තිබුණොත් නිවැරදි කරන්න ඕනි



99

## සැපයුම්කරුගේ ප්‍රකාශයයි ණයහිමි ලෙජරයයි සංසන්දනය කරන පියවර

**පියවර 1** → සැපයුම්කරුගේ ප්‍රකාශයේ සහ ණයහිමි ලෙජරයේ යන දෙකේම තියන අයිතම ලකුණු කරගන්න

**පියවර 2** → සැපයුම්කරුගේ ප්‍රකාශයේ ආරම්භක ශේෂ එකඟ කරන්න

**පියවර 3** → බැරපත් සඳහා අඩු කිරීමෙන් පසු ඉන්වොයිස් වටිනාකම ගෙවීම් සමග හිලව් කිරීම

**පියවර 4** → වෙනස්කම් හඳුනාගැනීම

100

## වෙනස්කම් ඇති වීමට හේතු

| සසඳන අයිතමය | බලපෑම |
| --- | --- |
| මාර්ගස්ථ ගෙවීම් <br> කාල වෙනස්කම් | චෙක්පතක් නිකුත් කළාම ලෙජරයේ වාර්තා කරනවා. ඒත් තවමත් සැපයුම්කරුට චෙක්පත ලැබිලා නැතුව එන ගමන් තියෙන්න පුළුවන් (තැපැල් ප්‍රමාද වගේ). ඒ නිසා වෙනසක් ඇති වෙන්න පුළුවන්. |
| අත්හැරුණු ඉන්වොයිසිපත් හා බැරපත් <br> වැරදි සහ කාල වෙනස්වීම් | ඉන්වොයිසි සහ බැරපත් පොදු ලෙජරයේ වාර්තා වුණාට ණයහිමි ලෙජරයේ වාර්තා නොවී තියෙන්නත්, වාර්තා කරන එකේ ප්‍රමාද තියෙන්නත් පුළුවන් |
| වෙනත් වැරදි <br> වැරදි | ඉන්වොයිසි, බැරපත්, ගෙවීම් වටිනාකම් වැරදියට සටහන් වෙන්න පුළුවන්, අත්හැරිලා තියෙන්න පුළුවන් |

101

## ප්‍රශ්න 10

පහත දී ඇති තොරතුරු අනුව සැපයුම්කරුගේ ප්‍රකාශ සහ ණයහිමි ලෙජර සැසඳීම් ප්‍රකාශයක් පිළියෙළ කරන්න

| ගිණුම් ප්‍රකාශනය රෙවෙලෝ සමාගම - නාවල | | | | |
| --- | --- | --- | --- | --- |
| ගිණුම් දෙපාර්තමේන්තුව - කාලිදාස් සමාගම - බටකැත්තර | | දිනය 20X1 මැයි 31 ගිණුම් අංකය - 038 | | |
| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
| 30/4/01 | පෙර ප්‍රකාශනයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය | | | 492,220 |
| 03/05/01 | ඉන්වොයිසි අංක 34207 | 129,400 | | 622,620 |
| 04/05/01 | ඉන්වොයිසි අංක 34242 | 22,720 | | 644,340 |
| 05/05/01 | ලැබූ ගෙවීම් | | 412,170 | 232,170 |
| 17/05/01 | ඉන්වොයිසි අංක 34237 | 394,950 | | 627,120 |
| 18/05/01 | බැරපත් අංක 00192 | | 64,400 | 562,720 |
| 21/05/01 | ඉන්වොයිසි අංක 34392 | 392,780 | | 955,500 |
| 28/05/01 | බැරපත් අංක 00199 | | 107,640 | 847,860 |
| ලැබිය යුතු වටිනාකම | | | | 847,860 |

102

| කාලිදාස් සමාගම - ණයහිමි ලෙජරය | | |
| --- | --- | --- |
| ගිණුමේ නම - රෙවොලෝ සමාගම යොමු අංකය - 045 | | වාර්තාවේ දිනය 20X1 ජූනි 1 |
| දිනය | විස්තරය | ශේෂය |
| 16/03/01 | ඉන්වොයිසි අංක 33004 | 350,700 |
| 20/03/01 | ඉන්වොයිසි අංක 33060 | 61,470 |
| 06/04/01 | ඉන්වොයිසි අංක 34114 | 80,050 |
| 03/05/01 | ඉන්වොයිසි අංක 34207 | 129,400 |
| 04/05/01 | ගෙවීම් | (412,170) |
| 06/05/01 | ඉන්වොයිසි අංක 34242 | 22,720 |
| 19/05/01 | ඉන්වොයිසි අංක 34327 | 394,950 |
| 19/05/01 | බැරපත් අංක 00192 | (64,400) |
| 28/05/01 | ගෙවීම් | (117,770) |
| 30/05/01 | බැරපත් අංක 00199 | (107,640) |
| ශේෂය | | 337,310 |

103

# ගැලපුම් සංකල්පය

Sandeepa Jayasekera - JMC 104

104

JMC vLearning "your virtual learning partner"

## ගැලපුම් සංකල්පය

උපයන ආදායමට

එරෙහිව ඊට අදාළ වියදම

ගැලපිය යුතුය.

Sandeepa Jayasekera - JMC 105

105

ඉසුරු විසින් රු. 500,000 ක් පිරිවැය වූ අයිතම රු. 750,000 කට පාරිභෝගිකයන්ට අලෙවි කරන ලදි. රු. 25,000 ක අලෙවිකරණ වියදමක් දරණ ලද අතර ප්‍රවාහන වියදම රු. 25,000 ක් විය. ලාභය ගණනය කරන්න.

| | |
|---|---|
| විකුණුම් | 750,000 |
| (-) විකුණුම් පිරිවැය | (500,000) |
| අලෙවිකරණ වියදම | (25,000) |
| ප්‍රවාහන වියදම | (25,000) |
| ලාභය | 200,000 |

Sandeepa Jayasekera - JMC 106

106

# ජර්නලය

Sandeepa Jayasekera - JMC 107

107

## ජර්නලය

වෙනත් මූලික පොතක් හරහා වාර්තා නොවන අනිකුත් සියළුම ගණුදෙනු වාර්තා කිරීම සඳහා පොදු ජර්නලය භාවිතා කරයි. ජර්නලයද මූලික පොත්වලින් එකක් වේ. සාමාන්‍යයෙන් වාර්තා නොවන සටහන් සඳහා මෙම පොදු ජර්නලය භාවිතා වේ.



108

JMC vLearning "your virtual learning partner

## ජර්නල් සටහනක ආකෘතිය

| දිනය | විස්තරය | හර රු. | බැර රු. |
|---|---|---|---|
| 01/02/X2 | බැංකු හර | 100,000 | |
| | ප්‍රාග්ධනය බැර | | 100,000 |
| | (මූලික ප්‍රාග්ධනය යෙදවීම) | | |

109


109

## ශේෂ පිරික්ෂුම භාවිතා කර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම.

Sandeepa Jayasekera - JMC 110

110

## හඳුන්වාදීම





ගිණුම් කාලච්ඡේද අවසානයේදී සියළුම ලෙජර් ගිණුම් ශේෂ කරනු ලැබේ. එම ශේෂයන් ශේෂ පිරික්ෂුම නමින් ලියවිල්ලකට අරගෙන යනු ලබයි. එම ශේෂ පිරික්ෂුමේ ශේෂ භාවිතා කර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබයි.

111

111

## ශේෂ පිරික්ෂුමක් නිර්මාණය කිරීමේ පියවර




112

112

JMC vLearning "Your virtual learning partner"

## දෝෂ

| ශේෂ පිරික්සුමෙන් හෙළිවන දෝෂ | ශේෂ පිරික්සුමෙන් හෙළි නොවන දෝෂ |
|---|---|
| එක් සටහනක් අත්හැරී තිබීම. | සම්පූර්ණ ගණුදෙනුවක් අත්හැරීම. |
| සටහන් දෙකම හර ලෙස හෝ බැර ලෙස සටහන් වීම. | හර සහ බැර සටහන් වැරදි ගිණුම්වල වාර්තා කිරීම. |
| එක් සටහනක වැරදි අගයක් සටහන් වීම. | එක් සටහනක වරද තවත් සටහනකින් හිලව් කිරීම.<br>රු. 100 ක දෝෂය තවත් රු. 100 ක දෝෂයකට හිලව් වීම. |
| | මූලධර්ම දෝෂ.<br>ණයගැති ලැබීම් ණයගැති හර සහ මුදල් බැර ලෙස වාර්තා කිරීම. |

113

## ප්‍රශ්න 11

මයුම් ව්‍යාපාරයේ පහත ගණුදෙනු සඳහා ශේෂ පිරික්සුම සකස් කරන්න.

1. මයුම් රු. 100,000 ක් ආයෝජනය කර ව්‍යාපාරය ආරම්භ කරන ලදි.
2. රු. 50,000 ක බැංකු ණයක් ලබා ගන්නා ලදි.
3. රු. 40,000 ක යන්ත්‍ර මිල දී ගෙන ඇත.
4. රු. 70,000 ක ණයට ගැණුම් සිදු කර ඇත.
5. රු. 25,000 ක වැටුප් ගෙවා ඇත.

Sandeepa Jayasekera - JMC 114

114

## ප්‍රශ්න 11

6. රු. 100,000 ක ණයට විකුණුම් සිදු කර ඇත.
7. ණයහිමියන්ට රු. 60,000 ක් ගෙවා ඇත.
8. ණයගැති ලැබීම් රු. 75,000
9. ක්ෂයවීම් රු. 2,000
10. ණය ගෙවීම් රු. 5,000 (රු. 1,000 ක් පොළිය වේ)
11. අවසාන තොගය රු. 15,000 කි.

Sandeepa Jayasekera - JMC 115

115

## ප්‍රශ්න 12

පහත ශේෂයන් වාරුනී සමාගමේ 20X9/12/30 දිනට අදාල වේ.

| ගිණුම | ශේෂය රු. |
|---|---|
| බැංකු ණය | 100,000 |
| බැංකු මුදල් | 35,000 |
| ප්‍රාග්ධනය | 100,000 |
| බදු වියදම | 15,000 |
| බදු ප්‍රතිපාදනය | 10,000 |
| වෙළඳ ණයහිමියන් | 75,000 |
| වෙළඳ ණයගැතියන් | 200,000 |
| ගැණුම් | 150,000 |
| විකුණුම් | 200,000 |
| පොළිය | 1,000 |
| වෙනත් වියදම් | 34,000 |
| වාහන | 50,000 |

Sandeepa Jayasekera - JMC 116

116

JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න 12

20X9/12/30 දිනට පහත ගණුදෙනු වාර්තා කළ යුතුය.

1. රු. 50,000 ක ගැණුම් සිදු කර ඇති අතර එම වටිනාකමින් 50% මුදලින් ගෙවා ඇත. ඉතිරිය ගෙවිය යුතු වේ.
2. රු. 30,000 ක විකුණුම් සිදුකර ඇති අතර ඉන් 25% ණයට කළ විකුණුම් වේ.
3. වාහන ක්ෂය රු. 5,000 කි.
4. සේවක වැටුප් රු. 10,000 කි. ඉන් 50% ක් මුදලින් ගෙවා ඇති අතර ඉතිරිය උපචිත වේ.

20X9/12/31 දිනට ශේෂ පිරික්ෂුම සකස් කරන්න.



## ලාභාලාභ ගිණුම






## මූල්‍ය ප්‍රකාශ සෑදීමේ පළමු පියවර - ලාභාලාභ ගිණුම

ලාභාලාභ ගිණුම යනු තවත් එක් ගිණුමකි. ලෙජරයේ තිබෙන සියළුම ආදායම් සහ වියදම් ගිණුම් ශේෂ ලාභාලාභ ගිණුමට මාරු කරනු ලබයි. එය ද්විත්ව සටහනක් මඟින් සිදු වේ. ලාභාලාභ ගිණුම තුල ඉතුරුවන ලාභය හිමිකම තුල හඳුනාගනී.

ලාභාලාභ ගිණුම

| | | | |
|---|---|---|---|
| ගැණුම් | 250,000 | විකුණුම් | 450,000 |
| කුලී වියදම | 50,000 | වෙනත් ආදායම් | 25,000 |
| වැටුප් වියදම | 100,000 | | |
| වෙනත් වියදම | 25,000 | | |
| ශේෂය ප/ගෙ | 50,000 | | |
| | 475,000 | | 475,000 |
| | | ශේෂය ඉ/ගෙ | 50,000 |



# ප්‍රශ්න 13

20X8/X9 වර්ෂයේ ෂේන් සමාගමේ පහත ගණුදෙනු සිදු වී ඇත.

1. රු. 500,000 ක අයිතම ණයට විකුණා ඇත.
2. රු. 300,000 ක් වටිනා අයිතම මුදලට විකුණා ඇත.
3. රු. 400,000 ක් වටිනා අයිතම ණයට ගෙන ඇත.
4. රු. 100,000 ක් වටිනා අයිතම අත්පිට ගැණුම් සිදුකර ඇත.
5. සේවක වැටුප් රු. 100,000 ක් වන අතර ඉන් රු. 25,000 උපචිත වේ.
6. ක්ෂය රු. 20,000 කි.
7. අලෙවිකරණ වියදම රු. 30,000 කි.



JMC vLearning
"your virtual learning partner"

## ප්‍රශ්න 13

8. අවසාන තොගය රු. 50,000 කි.
9. ගෙවිය යුතු බද්ද රු. 5,000 කි.
10. ණය පොලී ගෙවීම් රු. 5,000 කි.
11. ගෙවිය යුතු ගොඩනැගිලි කුලී රු. 25,000 කි.
12. ලැබිය යුතු ලාභාංශ ආදායම රු. 50,000 කි.
13. බොල් ණය රු. 3,000 කි.

T ගිණුම්, ශේෂ පිරික්සුම, ලාභාලාභ ගිණුම සහ ලාභාලාභ ප්‍රකාශය පිළියෙල කරන්න.



## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය





## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය - මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දෙවැනි පියවර

සියළුම ආදායම් වියදම් ශේෂ ලාභාලාභ ගිණුමට මාරු කළ පසු ඉතුරු වන්නේ ලාභාලාභ ශේෂය සහ අනිකුත් වත්කම්, වගකීම් සහ හිමිකම් ගිණුම් පමණි. මෙම ශේෂයන්ගේ ඉදිරියට ගෙන යන ශේෂ තුලින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කරයි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල නිරූපණය වන්නේ,
- වත්කම්
- වගකීම්
- හිමිකම්

ගිණුම්වල ඉදිරියට ගෙන ආ ශේෂ වේ.



## ප්‍රශ්න 14

පහත ගණුදෙනු වසන්ත ව්‍යාපාරයට අදාල වේ.

එම ගණුදෙනු සඳහා T ගිණුම්, ශේෂ පිරික්සුම ලාභාලාභ ගිණුම සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කරන්න.

1. රු. 1,000,000 ක් ආයෝජනය කර ව්‍යාපාරය ආරම්භ කරන ලදි.
2. රු. 500,000 ක ණයක් ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලදි.
3. රු. 800,000 ක් වටිනා භාණ්ඩ ණයට ගන්නා ලදි.
4. රු. 500,000 ක් ණයහිමියන්ට ගෙවන ලදි.
5. රු. 1,500,000 ක් වටිනා අයිතම ණයට විකුණන ලදි.



JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න 14

6. රු. 1,000,000 ක් ණයගැතියන්ගෙන් ලැබී ඇත.
7. රු. 200,000 ක උපකරණ මිලදී ගන්නා ලදී.
8. වැටුප් වියදම රු. 300,000 කි. ඉන් 25% ක් උපචිත වේ.
9. අලෙවිකරණ වියදම රු. 50,000 කි.
10. අවසාන තොගය රු. 40,000 කි.
11. ක්ෂය රු. 10,000 කි.
12. ණය පොලිය රු. 5,000 කි.
13. ගැනිලි රු. 10,000 කි.




# ගිණුම්කරණ මෘදුකාංග පද්ධති




JMC vLearning
"your virtual learning partner"

# සංකලිත ගිණුම්කරණ පද්ධති

ගිණුම්කරණ පද්ධති තුල මොඩියුල ගණනාවක් ඇත. මෙම මොඩියුල එකිනෙකට සම්බන්ධ වී ක්‍රියාකරන විට එය සංකලිත ගිණුම්කරණ පද්ධතියක් සේ සලකයි.





## ව්‍යාපාර සම්පත් සැළසුම්කරණ පද්ධති

ආයතනයක් තුල තිබෙන ප්‍රධාන ක්‍රියාවලීන් එකට එකතු කිරීමට සැලසුම් කළ මෘදුකාංග පැකේජයකි. සියළු ක්ෂේත්‍රයන්ගේ තොරතුරු අවශ්‍යතා ඉටු කරයි.

**ERP මෘදුකාංග** — සියළුම දත්ත, පදනම් යෙදවුම් අතර තොරතුරු ගලා යාම කළමනාකරණය

- මෙහෙයුම් - මිලදී ගැනීමේ සිට බෙදාහැරීම දක්වා තොග පාලනය කිරීම
- මූල්‍ය පාරිභෝගික ණය ඇගයීම සහ ප්‍රවර්ධන විකුණුම් වාර්තා
- ගිණුම්කරණය විකුණුම් සහ ගෙවීම් වාර්තා කිරීම සහ ව්‍යාපාර කාර්යසාධනය නිරීක්ෂණය කිරීම
- අලෙවිකරණය - විකුණුම් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ පාරිභෝගික සම්බන්ධතාවය හැසිරීම
- මානව සම්පත් - බඳවා ගැනීම, පුහුණු කිරීම, අගය කිරීම සහ ගෙවීම් කළමනාකරණය

Sandeepa Jayasekera - JMC 129

129

# බැංකු සැසඳුම් ප්‍රකාශනය

Sandeepa Jayasekera - JMC 130

130

| | |
|---|---|
| මුදල් පොතේ බැංකු ගිණුම | බැංකු ප්‍රකාශනය |

↓

**ව්‍යාපාරයේ බැංකු ජංගම ගිණුමට අදාළ ගනුදෙනු වාර්තා කරන**

| | |
|---|---|
| ව්‍යාපාරය පවත්වාගෙන යන ගිණුම | බැංකුව පිළියෙළ කරලා මාසිකව ව්‍යාපාරයට එවන ප්‍රකාශනය |

131

- බැංකුවේ ජංගම ගිණුමේ තියන සල්ලි ව්‍යාපාරය පැත්තෙන් වත්කමක් ඒ නිසා ඒක හර විදිහට සටහන් වෙනවා.
- ඒත්, බැංකුව පැත්තෙන් මේ සල්ලි වගකීමක් මොකද ආපහු ව්‍යාපාරය මේ සල්ලි ඉල්ලන දවසට දෙන්න ඕනි. ඒ නිසා බැංකුව මේ තැන්පතු මුදල බැර විදිහට තමා වාර්තා කරන්නේ.
- ඒ නිසා මුදල් පොතේ බැංකු ගිණුමේ ගනුදෙනු වාර්තා වෙන විදිහට සම්පූර්ණයෙන් අනිත් පැත්තට තමා බැංකු ප්‍රකාශයේ ගනුදෙනු සටහන් වෙන්නේ.



**මතක තියා ගන්න**

132

| මුදල් පොතට අනුව බැංකු තැන්පතුව | | බැංකුවට අනුව බැංකු තැන්පතුව |
|---|---|---|
| වත්කමකි | | වගකීමකි |
| වත්කම වැඩි වේ **හර** | මුදල් තැන්පත් කළ විට | වගකීම වැඩි වේ **බැර** |
| වත්කම අඩු වේ **බැර** | ගෙවීම් සිදු කළ විට | වගකීම අඩු වේ **හර** |

133

| මුදල් පොතට අනුව බැංකු අයිරාව | | බැංකුවට අනුව බැංකු අයිරාව |
|---|---|---|
| වගකීමකි | | වත්කමකි |
| වගකීම වැඩි වේ **බැර** | ගෙවීම් සිදු කළ විට | වත්කම වැඩි වේ **හර** |
| වගකීම අඩු වේ **හර** | මුදල් තැන්පත් කළ විට | වත්කම අඩු වේ **බැර** |

134

මුදල් පොතේ බැංකු ශේෂයයි බැංකු ප්‍රකාශනයේ ශේෂයයි සමාන සමාන වෙන්න ඕනි වුණත් පහල හේතු නිසා වෙනස්කම් තියෙන්න පුළුවන්

- වැරදි
- මග හැරීම්
  - බැංකු ගාස්තු
  - බැංකු පොළී
- කාල වෙනස්වීම්
  - තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්
  - නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්




135




# වැරදි

ගණකාධිකාරීවරගේ අතින් මුදල් පොතේ බැංකු ගිණුම ඇතුලේ
- ගණනය කිරීම් වැරදි
- ලැබීම් ගෙවීම් වාර්තා කිරීම් වැරදි තියෙන්න පුළුවන්

කලාතුරකින් බැංකුව කරපු වැරදි බැංකු ප්‍රකාශය ඇතුලේ තියෙන්න පුළුවන්

136

JMC vLearning your virtual learning partner

# බැංකු ගාස්තු සහ බැංකු පොළී

- බැංකුව සපයන සේවා වලට ගාස්තුවක් අය කරනවා
- ඒ වගේම බැංකුව සැපයූ අයිරා සහ ණය වෙනුවෙන් පොළී පොළී අය කරනවා
- මේ දෙකම ජංගම ගිණුමෙන් අය කර ගන්නවා
- ව්‍යාපාරය මෙම ගාස්තු ගැන දැනගන්නේ බැංකු ප්‍රකාශය ලැබුණාට පස්සේ






137

# කාල වෙනස්වීම්

තැන්පත් කළ නමුත්
උපලබ්ධි නොවූ චෙක්පත්

- ව්‍යාපාරයට ලැබිලා තැන්පත් කරපු චෙක්පත් මුදල් පොතේ බැංකු ගිණුමේ ලැබීම් විදිහට වාර්තා කරනවා
- ඒ වුණාට සමහර චෙක්පත් තවමත් නිශ්කාෂණය වෙලා නැති නිසා බැංකුව ඒ මුදල ව්‍යාපාරයේ ගිණුමට බැර කරලා නැති වෙන්න පුළුවන්




138

# කාල වෙනස්වීම්




නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්

- ව්‍යාපාරය යම් ගෙවීමකට චෙක්පතක් නිකුත් කරාම ඒක මුදල් පොතේ බැංකු ගිණුමෙන් අඩු කරලා පෙන්වනවා
- ඒත් චෙක්පත ලැබුණු පුද්ගලයා චෙක්පත තවමත් බැංකුවට ඉදිරිපත් කරලා නැති වෙන්න පුළුවන්
- බැංකු ගත කරලා තිබුණත් නිශ්කාෂණ ක්‍රියාවලියට දවසක් දෙකක් ගත වෙන්න පුළුවන්
- ඒ නිසා ඒ මුදල බැංකු ගිණුමෙන් අඩු වෙන්න කාලයක් ගත වෙන්න පුළුවන්

139

# බැංකු සැසඳුම් ප්‍රකාශනය

මුදල් පොතේ බැංකු ගිණුමේ ශේෂයයි බැංකු ප්‍රකාශනයට අනුව බැංකු ගිණුමේ ශේෂයයි අතර වෙනස්කම් හඳුනාගන්නයි අවශ්‍ය වෙනස්කම් ගිණුම් තියන්න බැංකු සැසඳුමක් මාසිකව හදනවා




140

# බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කරන පියවර

| | |
|---|---|
| 01. සසඳලා වෙනස්කම් හඳුනගන්න | මුදල් පොතේ බැංකු ගිණුමයි බැංකු ප්‍රකාශයයි සංසන්දනය කරලා වෙනස්කම් හඳුනාගන්න |
| ↓ | |
| 02. නිවැරදි කරන ලද මුදල් පොතේ බැංකු ශේෂය හදන්න | බැංකු ප්‍රකාශයේ ඇති මුදල් පොතේ බැංකු ගිණුමේ නැති අයිතම සහ මුදල් පොතේ බැංකු ගිණුමේ ඇති වැරදි හදලා නිවැරදි කරන ලද මුදල් පොතේ බැංකු ශේෂය හදාගන්න |
| ↓ | |
| 03. බැංකු සැසඳුම ශදන්න | බැංකු ශේෂයේ ඉඳන් නිවැරදි කරන ලද මුදල් පොතේ බැංකු ශේෂය වෙනකන් තියන වෙනස්කම් ටික (කාල වෙනස්කම්) පෙන්නන බැංකු සැසඳුම් ප්‍රකාශය හදන්න |



# නිවැරදි කරන ලද මුදල් පොතට කරන ගැලපිලි




**බැංකු ගාස්තු**

බැංකු ගාස්තු වියදම් හර
බැංකු ගිණුම බැර

**ණය සහ අයිරා පොළී**

ණය පොළී වියදම් හර
බැංකු ගිණුම බැර

**සෘජු ප්‍රේෂණ**

ණයගැති ප්‍රේෂණ
බැංකු ගිණුම හර
ණයගැති පාලන බැර

ලාභාංශ
බැංකු ගිණුම හර
ලාභාංශ ආදායම බැර



# නිවැරදි කරන ලද මුදල් පොතට කරන ගැලපිලි




**ස්ථාවර නියෝග සහ සෘජු හර**

බැංකු ණය වාරික
බැංකු ණය හර
බැංකු ණය පොළී හර
බැංකු ගිණුම බැර

ගොඩනැගිලි කුළී
ගොඩනැගිලි කුළී වියදම හර
බැංකු ගිණුම බැර



# නිවැරදි කරන ලද මුදල් පොතේ T ගිණුම් ආකෘතිය (අයිරාවක් නොමැති විට)

මුදල් පොත

| | | | |
|---|---|---|---|
| මුදල් පොතේ ඉදිරියට ගෙන ආ ශේෂය | XXX | බැංකු ගාස්තු | X |
| අඩුවෙන් ගණනය වීම් නිවැරදි කිරීම | X | අයිරා පොළිය | X |
| ණයගැති සෘජු ප්‍රේෂණ | XX | බැංකු ණය වාරික - ස්ථාවර නියෝග | XX |
| ලාභාංශ ලැබීම් සෘජු ප්‍රේෂණ | X | ගොඩනැගිලි කුළී - ස්ථාවර නියෝග | X |
| | | වැඩියෙන් ගණනය වීම් නිවැරදි කිරීම | X |
| | | ශේෂය ප/ගෙ | XX |
| | XXX | | XXX |
| ශේෂය ඉ/ගෙ | XX | | |



JMC vLearning
“your virtual learning partner”

## නිවැරදි කරන ලද මුදල් පොතේ ප්‍රකාශන ආකෘතිය (අයිරාවක් නොමැති විට)

| | | |
|---|---|---|
| **මුදල් පොතේ ඉදිරියට ගෙන ආ ශේෂය** | | XXX |
| **එකතු කළා** | | |
| අඩුවෙන් ගණනය වීම් නිවැරදි කිරීම | X | |
| ණයගැති සෘජු ප්‍රේෂණ | XX | |
| ලාභාංශ ලැබීම් සෘජු ප්‍රේෂණ | X | XX |
| **අඩු කළා** | | |
| බැංකු ගාස්තු | (X) | |
| අයිරා පොළිය | (X) | |
| බැංකු ණය වාරික - ස්ථාවර නියෝග | (XX) | |
| ගොඩනැගිලි කුළී - ස්ථාවර නියෝග | (X) | |
| වැඩියෙන් ගණනය වීම් නිවැරදි කිරීම | (X) | (XX) |
| **නිවැරදි කරන ලද මුදල් පොතේ ශේෂය** | | XX |

145

## නිවැරදි කරන ලද මුදල් පොතේ T ගිණුම් ආකෘතිය (අයිරාවක් ඇති විට)

මුදල් පොත

| | | | |
|---|---|---|---|
| අඩුවෙන් ගණනය වීම් නිවැරදි කිරීම | X | මුදල් පොතේ ඉදිරියට ගෙන ආ ශේෂය | XXX |
| ණයගැති සෘජු ප්‍රේෂණ | XX | බැංකු ගාස්තු | X |
| ලාභාංශ ලැබීම් සෘජු ප්‍රේෂණ | X | අයිරා පොළිය | X |
| | | බැංකු ණය වාරික - ස්ථාවර නියෝග | XX |
| | | ගොඩනැගිලි කුළී - ස්ථාවර නියෝග | X |
| ශේෂය ප/ගෙ | XX | වැඩියෙන් ගණනය වීම් නිවැරදි කිරීම | X |
| | XXX | | XXX |
| | | ශේෂය ඉ/ගෙ | XX |

146

## නිවැරදි කරන ලද මුදල් පොතේ ප්‍රකාශන ආකෘතිය (අයිරාවක් ඇති විට)

| | | |
|---|---|---|
| **මුදල් පොතේ ඉදිරියට ගෙන ආ ශේෂය** | | (XXX) |
| **අඩු කළා** | | |
| අඩුවෙන් ගණනය වීම් නිවැරදි කිරීම | X | |
| ණයගැති සෘජු ප්‍රේෂණ | XX | |
| ලාභාංශ ලැබීම් සෘජු ප්‍රේෂණ | X | XX |
| **එකතු කළා** | | |
| බැංකු ගාස්තු | (X) | |
| අයිරා පොළිය | (X) | |
| බැංකු ණය වාරික - ස්ථාවර නියෝග | (XX) | |
| ගොඩනැගිලි කුළී - ස්ථාවර නියෝග | (X) | |
| වැඩියෙන් ගණනය වීම් නිවැරදි කිරීම | (X) | (XX) |
| **නිවැරදි කරන ලද මුදල් පොතේ ශේෂය** | | (XX) |

147

## බැංකු සැසඳුම් ප්‍රකාශයේ පෙන්වන සංශෝධිත බැංකු ශේෂයත් එක්ක තියන වෙනස්කම්




- කාල වෙනස්වීම්
  - තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්
  - නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්

148

JMC vLearning
"your virtual learning partner"

## බැංකු සැසඳුම් ප්‍රකාශ ආකෘතිය (අයිරාවක් නොමැති විට)

| | | |
|---|---|---|
| **බැංකු ප්‍රකාශයට අනුව ශේෂය** | | XXX |
| **එකතු කළා** | | |
| තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් | X | XX |
| **අඩු කළා** | | |
| නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක් | (X) | (XX) |
| **නිවැරදි කරන ලද මුදල් පොතේ ශේෂය** | | XX |

149

## බැංකු සැසඳුම් ප්‍රකාශ ආකෘතිය (අයිරාවක් ඇති විට)

| | | |
|---|---|---|
| **බැංකු ප්‍රකාශයට අනුව ශේෂය** | | (XXX) |
| **එකතු කළා** | | |
| නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක් | X | XX |
| **අඩු කළා** | | |
| තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් | (X) | (XX) |
| **නිවැරදි කරන ලද මුදල් පොතේ ශේෂය** | | (XX) |

150

## ප්‍රශ්න 15

20X9/3/31 දිනට ආලෝකා සමාගමේ මුදල් පොතේ බැංකු ගිණුමේ ශේෂය රු 800,000ක හර ශේෂයක් වූ අතර බැංකු ප්‍රකාශයේ රු 1,100,000ක බැර ශේෂයක් තිබුණි. මෙම ශේෂ දෙක අතර වෙනසට හේතු පහත පරිදි විය.

1. මුදල් පොතේ හර පැත්ත රු 100,000ක් අඩුවෙන් එකතු කර ඇත.
2. තැන්පත් කළත් තවමත් බැංකුවට බැර නොවූ (උපලබ්ධි නොවූ චෙක්පත්) රු 200,000කි.
3. ණයහිමියන් සඳහා නිකුත් කළ නමුත් තවමත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම රු 400,000කි.

අවශ්‍ය වන්නේ
1. මුදල් පොත නිවැරදි කරන්න.
2. බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පොතේ ශේෂය සැසඳීමට ප්‍රකාශයක් පිළියෙළ කරන්න.

151

## ප්‍රශ්න 16

20X8/12/31 දිනට සමාගමේ මුදල් පොතට අනුව එහි බැංකු ගිණුමේ රු 150,000ක බැර ශේෂයක් පෙන්නුම් කරයි. එම ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ නොවේ. වෙනසට හේතු පහත පරිදි වේ.

මුදල් පොතේ වාර්තා නොකළ ගනුදෙනු
- බැංකු ගාස්තු රු. 36,000
- තැන්පත් ගිණුමෙන් ජංගම ගිණුමට මාරු කිරීම් රු. 500,000

බැංකු ප්‍රකාශනයේ වාර්තා නොවීම්
- ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 116,000
- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 630,000

152

## ප්‍රශ්න 16

බැංකුව විසින් රු. 400,000ක් වැරදීමකින් සමාගමේ ගිණුමට හර කර ඇති බව හෙළිදරව් විය

**අවශ්‍ය වන්නේ**

බැංකු ප්‍රකාශනයේ සඳහන් වූ ආරම්භක ශේෂය කුමක්ද?

153

## ප්‍රශ්න 17

ව්‍යාපාරයක බැංකු ප්‍රකාශනයේ මුදල් පොතේ සටහන් නොවූ රු 715,000ක සෘජු හර කිරීම් සහ රු 353,000ක ආයෝජන ආදායමක් පෙන්වයි. ගිණුම් කාලච්ඡේදය අවසාන දිනයේදී මුදල් පොතේ ඇතුලත් කළ රු 875,000ක ගනුදෙනුකරුවෙකුගේ චෙක්පත බැංකු ප්‍රකාශනයේ පෙන්නුම් නොකරයි. මුදල් පොතේ රු 610,000ක බැර ශේෂයක් පෙන්නුම් කරයි නම් නිවැරදි කරන ලද මුදල් පොතේ ශේෂය සහ බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය ගණනය කරන්න.

154

## ප්‍රශ්න 18

20X0 ජුනි 30 දිනට කුක්ගේ මුදල් පොතට අනුව බැංකු ජංගම ගිණුමට අදාල මුදල් රු. 300 බැංකු අයිරාවක් පෙන්වයි. 20X0 ජුනි 30 දින බැංකු ප්‍රකාශනයේ කුක්ගේ බැංකු ශේෂය රු 65 ක බැර ශේෂයක් පෙන්වයි.

මුදල් පොත ගෙන බැංකු ප්‍රකාශනය සමග පරීක්ෂා කිරීමෙන් පසු ඔබ පහත දෑ සොයා ගෙන ඇත

1. රු. 500 අගයට ලියන ලද චෙක්පත් මුදල් පොතේ ඇතුලත් කලද, බැංකුවට ඉදිරිපත් කර නැත
2. රු. 400 අගයට ලැබුණු තැන්පත් කරන ලද චෙක්පත් මුදල් පොතේ ඇතුලත් කලද බැංකුව විසින් මෙතෙක් බැර කිරීම කර නැත
3. කුක් විසින් ලබා දුන් උපදෙස් මත ඉතිරි කිරීම් වෙනුවෙන් ලද රු. 60 ක්වූ පොලිය 20X0 ජූලි 5 දින ඔහුගේ ජංගම ගිණුමට මාරු කර ඇත. කෙසේ වෙතත් මෙම අගය 20X0 ජුනි 30 දිනට මුදල් පොතට බැර කොට ඇත
4. රු. 35 ක බැංකු ප්‍රකාශනයේ සදහන් බැංකු ගාස්තු මුදල් පොතට ඇතුලත් කර නැත
5. මුදල් පොතේ ගෙවීම් පැත්ත රු. 10 ක් අඩුවෙන් ගණනය සිදු කර ඇත.

155

## ප්‍රශ්න 18

6. බැංකුව වෙත කෙලින්ම ලද ලාභාංශ ආදායම රු. 200 ක් මුදල් පොතේ ඇතුලත් කර නැත
7. තැන්පත් ගිණුමකින් ගෙවන ලද රු. 50 ක් මුදල් පොතේ ජංගම ගිණුමෙන් කරන ලද ගෙවීමක් ලෙස පෙන්වා ඇත
8. ණයහිමියෙක් වන ජෝන්ස් වෙත නිකුත් කරන ලද රු. 25 ක් වූ චෙක්පත දින ඉකුත් වීම නිසා නැවත චෙක්පතක් නිකුත් කර ඇතත් එය නැවත මුදල් පොතේ ඇතුලත් කර ඒ සදහා වෙනත් සටහනක් ඇතුලත් කර නැත. මෙම චෙක්පත් දෙකම ඉහත සදහන් ඉදිරිපත් නොකල චෙක්පත් වල ඇතුලත් කර ඇත.

**අවශ්‍ය වන්නේ,**

(අ) මුදල් පොතේ අවශ්‍ය ගැලපීම් වාර්තා කිරීම
(ආ) නිවැරදි කරන ලද මුදල් පොතේ ශේෂය සමග බැංකු ප්‍රකාශනයේ ශේෂය සැසඳීම සඳහා ප්‍රකාශනයක් පිලියෙල කිරීම

156

# ප්‍රශ්න 19

පී.ඩබ්.ඩබ් සමාගම ගැන පහත දී ඇති බැංකු සැසදුම් තොරතුරු වලින් ඔබ විසින්

1. 20X2 ඔක් 30 දිනට බැංකු මුදල් ගිණුමේ නිවැරදි ශේෂය පෙන්වීම සඳහා අවශ්‍ය අතිරේක සටහන් පිළියෙල කරන්න
2. 20X2 ඔක් 30 දිනට ඉහත 1 කොටසේ නිවැරදි කරන ලද මුදල් පොතට අනුව බැංකු ගිණුමේ ශේෂය සමග බැංකු සමාගමෙන් ලද බැංකු ප්‍රකාශනය සමඟ සැසදීමේ ප්‍රකාශයක් පිලියෙල කරන්න.

පී.ඩබ්.ඩබ්. සමාගමේ බැංකුවෙහි ඇති මුදල් සඳහා වු මුදල් ගිණුම

157

| 20X2 ඔක් | | රු. | 20X2 ඔක් | | රු. |
|---|---|---|---|---|---|
| 1 | ශේෂය ඉ/ගෙ | 274 | | | |
| 8 | කිවු නිෂ්පාදකයා | 3,443 | 1 | වැටුප් | 3,146 |
| 8 | ආර්. සිමෙන්ති | 1,146 | 1 | සුළු මුදල් | 55 |
| 11 | එස් සමාගම | 638 | 8 | වැටුප් | 3,106 |
| 11 | ටී සහ පුත්‍රයෝ | 512 | 8 | සුළු මුදල් | 39 |
| 11 | යු සහ සමාගම | 4,174 | 15 | වැටුප් | 3,029 |
| 15 | වී සමාගම | 1,426 | 15 | සුළු මුදල් | 78 |
| 15 | ඩබ් විදුලි කාර්මික | 887 | 22 | ඒ සහ පුත්‍රයෝ | 929 |
| 22 | එක්ස් සහ සංගමය | 1,202 | 22 | බී සමාගම | 134 |
| 26 | වයි සමාගම | 2,875 | 22 | සී හා සමාගම | 77 |
| 26 | ඊසෙඩ් සමාගම | 982 | 22 | ඩී සහ ඊ | 263 |
| 29 | ඒබීසී සමාගම | 1,003 | 22 | ඒ වයි සමාගම | 1,782 |
| 29 | ඩී සංස්ථාව | 722 | 22 | පී සමාගම | 230 |
| 29 | පි එච් අයි සමාගම | 2,461 | 22 | වැටුප් | 3,217 |
| 31 | ශේෂය ප/ගෙ | 14 | 22 | සුළු මුදල් | 91 |
| | | | 25 | එච් හා හවුල්කරුවෝ | 26 |
| | | | 26 | ජේ පුත්‍ර සමාගම | 868 |
| | | | 26 | කේ සහ සමාගම | 107 |
| | | | 26 | එල්, එම් සහ එන් | 666 |
| | | | 28 | ඕ සහ සමාගම | 112 |
| | | | 29 | වැටුප් | 3,191 |
| | | | 29 | සුළු මුදල් | 52 |
| | | | 29 | පී සහ පුත්‍රයෝ | 561 |
| | | 21,759 | | | 21,759 |

158

| 20o2 ඔක්තෝම්බර් | ගෙවීම් රු. | ලැබීම් රු. | ශේෂය රු. |
|---|---|---|---|
| 1 | | | 1,135 |
| 1 චෙක්පත් | 55 | | |
| 1 චෙක්පත් | 3,146 | | |
| 1 චෙක්පත් | 421 | | 2,487 අයිරා |
| 2 චෙක්පත් | 73 | | |
| 2 චෙක්පත් | 155 | | 2,715 අයිරා |
| 6 චෙක්පත් | 212 | | 2,927 අයිරා |
| 8 විවිධ බැර | | 4,589 | |
| 8 චෙක්පත් | 3,106 | | |
| 8 චෙක්පත් | 39 | | 1,483 අයිරා |
| 11 විවිධ බැර | | 5,324 | 3,841 |
| 15 විවිධ බැර | | 2,313 | |
| 15 චෙක්පත් | 78 | | |
| 15 චෙක්පත් | 3,029 | | 3,047 |
| 22 විවිධ බැර | | 1,202 | |
| 22 චෙක්පත් | 3,217 | | |
| 22 චෙක්පත් | 91 | | 941 |
| 25 චෙක්පත් | 1,782 | | |

| 20o2 ඔක්තෝම්බර් | ගෙවීම් රු. | ලැබීම් රු. | ශේෂය රු. |
|---|---|---|---|
| 25 චෙක්පත් | 134 | | 975 අයිරා |
| 26 චෙක්පත් | 929 | | |
| 26 විවිධ බැර | | 3,857 | |
| 26 චෙක්පත් | 230 | | 1,723 |
| 27 චෙක්පත් | 263 | | |
| 27 චෙක්පත් | 77 | | 1,383 |
| 29 විවිධ ණය | | 4,186 | |
| 29 චෙක්පත් | 52 | | |
| 29 චෙක්පත් | 3,191 | | |
| 29 චෙක්පත් | 26 | | |
| 29 ලාභාංශ | | 2,728 | |
| 29 චෙක්පත් | 666 | | 4,362 |
| 31 බැංකු ගාස්තු | 936 | | 3,426 |

159